# 4 වැනි පරිච්ජේදය







# මිල, වැටුප් හා සේවා නියුක්තිය

## 4.1 සමස්ත නිරීක්ෂණ

වර්ෂ 2006 ආරම්භ වූයේ දේශීය නිෂ්පාදනයේ වූ වර්ධනයට සහ දැඩි මූල්‍ය ප්‍රතිපත්තීන්ට ප්‍රතිචාර වශයෙන් පාරිභෝගික මිල උද්ධමනයේ මධ්‍යස්ථ හැසිරීමක් පෙන්නුම් කරමිනි. එසේ වුවද, විශේෂයෙන්ම ඉන්ධන මිල ගණන් ඉහළ යාම වැනි පසුව සිදුවූ වර්ධනයන් හේතු කොටගෙන උද්ධමනයට බලපෑමක් ඇති කරමින් වසරේ ඉතිරි කොටසේදී මෙම ප්‍රවනතාවය ප්‍රතිවිරුද්ධ දිශාවට යොමු වීමක් සිදුවිය. මිල ඉහළ යාමට ඉල්ලුම් පීඩනය, පරිපාලිත මිල ගණන් ඉහළ යාම සහ සැපයුම් අංශයේ වූ බාධක සමස්ත ලෙස බලපාන ලදි. පාරිභෝජන වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික සහ රාජ්‍ය අංශ දෙකටම සපයන ලද ණය ඉහළ යාම මෙන්ම රජයේ වියදම් සහ රාජ්‍ය ණය ඉහළ යාම නිසා ඇතිවූ සාපේක්ෂව ඉහළ මූල්‍ය වර්ධනය තුළින් ඉල්ලුම් අංශයෙන් වූ පීඩනය පෙන්නුම් කෙරිණි.

2006 වර්ෂයේදී රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප් ඉහළ දැමීමද ඉල්ලුම් අංශයෙන් වූ පීඩනය තවදුරටත් වැඩි කිරීමට හේතු විය. සැපයුම් අංශය සැලකීමේදී ඉතා සරු වී අස්වැන්නක් දෙවන අනුගාමී වසර සඳහාද වාර්තා කිරීමත් සමග දේශීය කෘෂිකාර්මික නිෂ්පාදන පුළුල් වීම වසරේ පළමු භාගයේදී මිල පීඩනය ලිහිල් වීමට උපකාරී වූ නමුදු අයහපත් කාලගුණික තත්ත්වය හේතු කොට ගෙන විශේෂයෙන්ම එළවළු සහ අතිරේක බෝග අස්වැන්න නෙළීමේදී සහ ඒවා බෙදාහැරීමේදී ඇති වූ බාධක වසරේ දෙවන භාගයේදී මිල ඉහළ යාමට හේතු විය. වසරේ දෙවන කාර්තුවේ සිට අවස්ථා කිහිපයකදී ඉන්ධන මිල ගණන් ඉහළට සංශෝධනය කිරීම ප්‍රධාන වශයෙන් හේතු කොටගෙන නිෂ්පාදන සහ ප්‍රවාහන පිරිවැය ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස මිල ගණන් මත අඛණ්ඩ පීඩනයක් ඇති විය. ඉන්ධන මිල ගණන්වල වැඩිවීම මිල මට්ටම් ඉහළ යාම කෙරෙහි බලපෑ නමුදු බොහෝ විට උද්ධමනකාරී ලෙස මූල්‍යයනය කරනු ලබන සහනාධාර වියදම් අඩු කිරීමට රජයට හැකිවන නිසා එහි සමස්ථ ප්‍රතිඵලය අනාගත උද්ධමනය පහළ වැටීමට හේතු වනු ඇත. එසේම දේශීය නිෂ්පාදන සඳහා දිරිගැන්වීමක් වශයෙන් ඇතැම් පාරිභෝගික ආනයනික භාණ්ඩ මත පනවා තිබූ තීරු බදු වැඩිකිරීම ආනයනික පිරිවැය ඉහළ දැමීමට හේතු වූ අතර එයද වසර තුළදී පාරිභෝගික මිල උද්ධමනය වැඩි කිරීමට දායක විය.

**රාජ්‍ය අංශයේ මූර්ත වැටුප් ඉහළ යෑමක් පෙන්වන අතර පෞද්ගලික අංශයේ මූර්ත වැටුප් සංකෝචනය වීමක් 2006 තුළ පෙන්නුම් කළේය.** මධ්‍යම රජයේ සේවක-යන්ගේ සමස්ත නාමික වැටුප්වල ඉහළ යාම සියයට 30.5 වනවිට මූර්ත වැටුප්වල ඉහළ යාම සියයට 15.1 ක් ලෙස දැක්වුණි. මූර්ත වැටුප්වල මෙම වැඩිවීම පවත්වා ගැනීමට රජය විසින් රාජ්‍ය අංශයේ සේවකයන් හට 2006 ජනවාරි 01 වැනි දින සිට ජීවන වියදම් දීමනාවක් ලබාදීම හේතුවිය.

**සේවා වියුක්ති අනුපාතයේ පැහැදිලි අඩුවීමක් පෙන්වමින් වසර 2006 දී එය සියයට 6.5 දක්වා අඩුවිය.** මෙයින් මූලික වශයෙන්ම කෘෂිකාර්මික හා ඉදිකිරීම් අංශයේ ඇති වූ සේවා නියුක්තියේ ඉහළ යාමත් ස්වයං රැකියා සේවා නියුක්තියේ ඉහළ යාමත් පෙන්නුම් කරයි. තව ද රජය විසින් තරුණ පෙළට වැඩි රැකියා අවස්ථාවන් ලබාදීමේ උත්සාහය ද මෙම සේවා වියුක්ති අනුපාතය අඩුවීමට උපකාරී වුණි. කෙසේ වෙතත් විදේශ රැකියාවල නියුක්ත වීමේ අවස්ථාවන් 2006 දී අඩු වූ අතර එයට හේතුව වූයේ මැදපෙරදිග කලාපයේ ඇති වූ දේශපාලන අස්ථාවර භාවයයි.


## 4.2 මිල

### මිල විචලනයන් මත බලපාන සාධක


**මිල මත ඇතිවන ඉල්ලුමේ ආතතිය සහ පිරිවැයේ තෙරපුම යන සාධක දෙකෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස 2005 වසරේ මිල මට්ටම් සමග සැසඳීමේ දී 2006 වසරේ දී පොදු මිල මට්ටම්වල තියුණු ඉහළ යාමක් සිදුවිය.** 2006 වසරේ දී උද්ධමනය ඉහළ යාම, කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) සහ ශ්‍රී ලංකා පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (ශ්‍රී ලංකා පා.මි.ද.) පිළිවෙලින් සියයට 13.7 ක සහ 9.5 ක වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතයන් වාර්තා කිරීම තුළින් සහ අනිකුත් සියලුම මිල දර්ශකවල ඉහළ වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතයන් වාර්තා කිරීමත් තුළින් පෙන්නුම් කෙරිණ.

**මූල්‍ය ප්‍රසාරණය මෙන්ම රාජ්‍ය වියදම් සහ රජයේ ණය ඉහළ යාම හේතු කොට ගෙන වසර ආරම්භයේ දී ඉලක්ක කළ ප්‍රමාණයට වඩා වැඩි අනුපාතයකින් සංචිත මුදල් වැඩිවීම තුළින් ඉල්ලුම් අංශයෙන් වූ පීඩනය**

**4.1 රූප සටහන** මිල දර්ශකවල වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම්




**4.2 රූප සටහන** මිල දර්ශකවල ලක්ෂ්‍යමය වෙනස්වීම්



**4.1 සංඛ්‍යා සටහන**

## මිල දර්ශකවල වෙනස්වීම්

| දර්ශකය | දර්ශකයේ සාමාන්‍ය | | | ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස | | වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | 2004 | 2005 | 2006 (අ) | දෙසැ. 2005/දෙසැ. 2004 | දෙසැ. 2006/දෙසැ. 2005 (අ) | 2005/2004 | 2006/2005 (අ) |
| කො.පා.මි.ද. | 3,632.8 | 4,055.5 | 4,610.8 | 8.0 | 19.3 | 11.6 | 13.7 |
| කො.දි.පා.මි.ද. | 148.5 | 163.1 | 176.6 | 4.3 | 14.5 | 9.8 | 8.3 |
| අනුරාධපුර පා.මි.ද. | 158.5 | 172.8 | 188.9 | 3.4 | 16.4 | 9.0 | 9.3 |
| මාතලේ පා.මි.ද. | 151.6 | 166.6 | 182.3 | 4.6 | 16.9 | 9.9 | 9.4 |
| මාතර පා.මි.ද. | 147.2 | 157.2 | 169.3 | 2.1 | 16.0 | 6.8 | 7.7 |
| ශ්‍රී ලංකා පා.මි.ද. | 170.9 | 189.1 | 207.2 | 3.6 | 17.9 | 10.6 | 9.5 |
| තොග මි.ද. | 1,889.0 | 2,105.9 | 2351.6 | 1.7 | 17.3 | 11.5 | 11.7 |
| ද.දේ.නි. අවධමනකය | 183.6 | 201.8 | 222.6 | - | - | 9.9 | 10.3 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

ජනනය විය. සමස්ත උද්ධමනයෙන් මූල්‍ය ප්‍රසාරණයට වඩාත් සංවේදීව ප්‍රතිචාර දක්වන කොටස වන යටිදැරි උද්ධමනයේ ඉහළ දිශාවට යොමු වූ උපනතිය මගින් ඉල්ලුමෙන් වූ පීඩනය පෙන්නුම් කෙරිණ.[1]

**මූල්‍ය වර්ධනය අඛණ්ඩව ඉහළ මට්ටමක රැඳී පැවැති අතර වසර අවසාන වනවිට එය සියයට 17.8 ක් පමණ විය.** ඉහළ මූල්‍ය වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් ම හේතු වූයේ, බැංකු අංශය හරහා රාජ්‍ය සහ පෞද්ගලික අංශ දෙකට ම සපයන ලද ණය ප්‍රසාරණයේ ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ දේශීය වත්කම්වල වර්ධනයයි. වෙළෙඳාම්, නිශ්චල දේපල හා නිවාස, කල්බදු සහ පාරිභෝජන වලට සම්බන්ධ ආර්ථික ක්‍රියාකාරකම්වල වර්ධනය හේතුකොට ගෙන පෞද්ගලික අංශයේ ණය ඉහළ අනුපාතයකින් අඛණ්ඩව වර්ධනය වූ අතර 2006 දෙසැම්බර් වනවිට එය සියයට 24.8 ක් කරා ළඟා විය. රාජ්‍ය අංශයට සපයන ලද තාවකාලික අත්තිකාරම් ඉහළ යාම අධික මූල්‍ය ප්‍රසාරණයට දායක වූ අතර, මෙමගින් ඉල්ලුමෙන් ජනිත කළ උද්ධමනය තවදුරටත් වැඩි කරන ලදී. ඉල්ලුම් කළමනාකරණය තවදුරටත් ශක්තිමත් කිරීමේ නව උත්සාහයන්ගේ අවශ්‍යතාවය මෙයින් පෙන්නුම් කෙරේ.

**දේශීයව නිෂ්පාදිත සහ ආනයනික ආහාර වර්ගවල මිල ගණන් තුළින් සැපයුම් අංශයේ පැවැති බාධක පිළිබිඹු විය.** අන්තර් අස්වනු කාල පරිච්ඡේදය තුළ දී සැපයුම් තත්ත්වයේ හිඟකම ඉතා අයහපත් කාලගුණික තත්ත්වය මගින් තවදුරටත් උග්‍ර කිරීම හේතු කොටගෙන වසරේ අවසාන භාගයේ දී එළවළු මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. සුනාමි ව්‍යසනයෙන් පසුව මත්ස්‍ය කර්මාන්තය සම්පූර්ණයෙන් ම වාගේ යථා තත්ත්වයට පත් වී තිබුණ ද, උතුරු සහ නැගෙනහිර පළාත්වල පැවති අහිතකර ආරක්ෂක තත්ත්වයන් හේතු කොට ගෙන භාණ්ඩ බෙදාහැරීමේ ක්‍රියාවලිය මත ඇති වූ බාධක, මාළුවල තොග මිල සහ සිල්ලර මිල යන දෙකම ඉහළ යාමට බලපාන ලදී. ඉහළ මාළු මිල ගණන්වල ආදේශන ප්‍රතිවිපාකයේ ප්‍රතිඵලයක් වශයෙන් මස්, බිත්තර සහ කරවල මිල ගණන් ඉහළ ගියේය. සැපයුම් අංශයේ සහ බාහිර සාධකයන්ගේ බලපෑම් හේතු කොටගෙන රතුළූණු, අර්තාපල් සහ වියළි මිරිස් වැනි ප්‍රධාන ආහාර වර්ග කිහිපයක මිල ගණන් සැලකිය යුතු ලෙස වැඩිවිණි. ඉහළ ගිය ප්‍රවාහන පිරිවැයත් සමග සිදු වූ අතරමැදි යෙදවුම් පිරිවැය වැඩිවීම ඉහත මිල වර්ධනයන් කෙරෙහි බලපෑ අනෙකුත් සාධක විය.

**තීරුබදු සංශෝධන සහ විනිමය අනුපාත අව ප්‍රමාණයවීම සමග බැඳුණු ඉහළ අන්තර්ජාතික මිල ආනයනික භාණ්ඩයන්ගේ මිල ගණන් වැඩිවීමට හේතු සාධක විය.** දේශීය ඉන්ධන මිල ගණන් සංශෝධනයන්ට මග පාදමින් බොර තෙල් බැරලයක ආනයන මිල 2005 වර්ෂයේ දී වූ ඇමෙරිකානු ඩොලර් 53 ට සාපේක්ෂව 2006 වර්ෂයේ දී ඇමෙරිකානු ඩොලර් 64 ක් වූ අතර, එය සියයට 22 ක පමණ මිල ඉහළ යාමක් විය. අන්තර්ජාතිකව ඉහළ යන ඛනිජ තෙල් මිල ගණන්වලට ප්‍රතිචාර දක්වමින් ගැසලීන්වලට ආදේශකයක් වශයෙන් එතනෝල් නිපදවීමට උක්දඬු භාවිතා කිරීම හේතු කොටගෙන අන්තර්ජාතික වෙළෙඳපොළට සීනි සැපයීම පහත වැටීමේ ප්‍රතිඵලයක් ලෙස 2006 වසරේ දී ජගත් වෙළෙඳපොළෙහි සීනි මිල තියුණු ලෙස ඉහළ ගියේය. තිරිඟු ඇටවල ඉහළ ආනයනික මිල ගණන් දේශීය තිරිඟු පිටි සහ පාන් මිල වැඩි කිරීමට හේතු විය. 2006 පෙබරවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රජය විසින් ආනයනික තිරිඟු පිටි සඳහා කිලෝග්රෑම් එකකට රු. 10 ක අතිරේක තීරු බද්දක් පැනවූ අතර, ආනයනික සහල් සඳහා වූ කිලෝග්‍රෑම් එකකට රු. 9 ක් පමණ වූ තීරු බද්ද රු.20 ක් දක්වා වැඩි කරන ලදී. 2007 අය-වැය මගින් වරාය සහ ගුවන් තොටුපොළ අයබදු සහ දේශීය නිපැයුම් බද්ද වැඩි කිරීමේ සංශෝධන ඉහළ යන ආනයනික මිල ගණන් වසර අවසාන වනවිට තවදුරටත් වැඩි කිරීමට දායක විය. තව ද, 2006 වර්ෂයේ දී වැඩි කරන ලද නැව් කුලී සහ රක්ෂණ ගාස්තු ද ආයනයික පිරිවැය ඉහළ යාමට හේතු විය.

**2006 වසරේ දී මිල ගණන් ඉහළ යාමට පරිපාලිත මිල සංශෝධන බලපෑම් ඇති කරන ලදී.** දේශීයව නිෂ්පාදිත

[1] නිරන්තර මිල විචලතාවයන් සහ පරිපාලිත මිල ගණන් සහිත අයිතම ඉවත් කිරීමෙන් පසුව සකස් කරනු ලබන උද්ධමන අනුපාතිකය

**4.2 සංඛ්‍යා සටහන** — **ආනයනික සහ දේශීයව නිෂ්පාදිත ප්‍රධාන අයිතමයන්ගේ සිල්ලර මිල ගණන්**

| අයිතමය | ඒකකය | ශ්‍රී ලංකා පා.මි.ද. භරිත | මිල රු. | | | | | | ප්‍රතිශත වෙනස | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | වාර්ෂික සාමාන්‍යය | | | 2004 | 2005 | 2006(අ) | වාර්ෂික සාමාන්‍යය | | ලක්ෂ්‍යමය | |
| | | | 2004 | 2005 | 2006(අ) | දෙසැ. | දෙසැ. | දෙසැ. | 2005/2004 | 2006/2005 | 2005/2004 | 2006/2005 |
| **දේශීය** | | | | | | | | | | | | |
| රතු කැකුළු සහල් | කි.ග්‍රෑ. 1ක් | | 35.30 | 32.83 | 31.22 | 41.86 | 32.10 | 38.19 | -7.0 | -4.9 | -23.3 | 19.0 |
| කම්බාපු සහල් | ,, | 16.3 | 34.03 | 31.75 | 31.49 | 39.29 | 33.65 | 37.95 | -6.7 | -0.8 | -14.4 | 12.8 |
| කෝරා සහල් | ,, | | 33.51 | 31.72 | 30.85 | 38.16 | 32.46 | 34.79 | -5.3 | -2.7 | -14.9 | 7.2 |
| පොල් (මධ්‍යම ප්‍රමාණය) | එකක් | 5.4 | 12.68 | 16.61 | 15.68 | 18.65 | 16.39 | 18.59 | 31.0 | -5.6 | -12.1 | 13.4 |
| මාළු (කෙළවල්ලා) | කි.ග්‍රෑ. 1ක් | 1.4 | 240.41 | 263.74 | 308.15 | 248.10 | 275.60 | 333.66 | 9.7 | 16.8 | 11.1 | 21.1 |
| බෝංචි | ,, | 1.3 | 56.35 | 69.40 | 76.14 | 53.56 | 73.64 | 101.97 | 23.2 | 9.7 | 37.5 | 38.5 |
| වම්බටු | ,, | 0.9 | 35.55 | 42.06 | 47.74 | 51.70 | 45.76 | 71.20 | 18.3 | 13.5 | -11.5 | 55.6 |
| බිත්තර | එකක් | 0.6 | 5.45 | 7.26 | 7.07 | 6.86 | 6.71 | 9.07 | 33.2 | -2.6 | -2.2 | 35.2 |
| **ආනයනික** | | | | | | | | | | | | |
| සීනි | කි.ග්‍රෑ. 1ක් | 3.4 | 37.51 | 41.94 | 60.22 | 38.70 | 43.66 | 65.31 | 11.8 | 43.6 | 12.8 | 49.6 |
| කිරිපිටි | ග්‍රෑ. 400 ක් | 3.3 | 137.13 | 156.31 | 160.58 | 149.58 | 158.98 | 165.83 | 14.0 | 2.7 | 6.3 | 4.3 |
| රතු පරිප්පු | කි.ග්‍රෑ. 1ක් | 1.9 | 69.46 | 76.51 | 75.52 | 75.67 | 75.87 | 81.99 | 10.1 | -1.3 | 0.3 | 8.1 |
| තිරිඟු පිටි | ,, | 0.9 | 25.99 | 29.00 | 34.25 | 27.41 | 29.13 | 40.47 | 11.6 | 18.1 | 6.3 | 38.9 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

සහ ආනයනික භාණ්ඩවල සමස්ත මිල මට්ටම් තවදුරටත් වැඩි කිරීමට මෙම තත්ත්වය දායක විය. ඉන්ධන, විදුලිය, ප්‍රවාහන, මත්පැන් සහ දුම්කොළ මිල ගණන් මත සැලකිය යුතු මිල සංශෝධන සිදු කරන ලදී. වසර තුළ තුන් වතාවක දී පමණ දේශීය ඉන්ධන මිල සංශෝධනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පෙට්‍රල් සහ ඩීසල් මිල ගණන් පිළිවෙලින් සියයට 15 කින් සහ සියයට 20 කින් පමණ 2006 වර්ෂය තුළ දී ඉහළ ගියේය. ඉන්ධන සහනාධාර හේතුවෙන් රාජ්‍ය මූල්‍ය අංශය දුර්වලවීමෙන් ඇතිවිය හැකි දීර්ඝ කාලීන උද්ධමන තත්ත්වය වළකා ගැනීම සඳහා රජය මගින් දරන ඉන්ධන සහනාධාර ඉවත් කිරීමට මෙම ඉන්ධන මිල සංශෝධන අත්‍යවශ්‍ය විය.

## මිල ගණන්වල ඍතුමය විචලතාවය

**ශ්‍රී ලංකාවේ පාරිභෝගික මිල ගණන් පැහැදිලි ඍතුමය රටාවක් පෙන්නුම් කරන අතර පාරිභෝගික මිල දර්ශකවල විචලතාවයන් තුළින් මෙම තත්ත්වය විද්‍යමාන කෙරේ.** සහල්, එළවළු, ධාන්‍ය සහ අනෙකුත් අතිරේක බෝග වැනි කෘෂිකාර්මික නිෂ්පාදනවල ඍතුමය වෙනස්කම් වලට මග පාදමින්, මෝසම් දෙකට සමපාතව ප්‍රධාන කෘෂිකාර්මික කන්න දෙකක් එනම් යල (අප්‍රේල්-අගෝස්තු) සහ මහ (සැප්තැම්බර්-මාර්තු) පවතී. ඒ අනුව, ප්‍රධාන අස්වනු කාල පරිච්ඡේද දෙක වන පෙබරවාරි සිට මාර්තු සහ ජූලි සිට අගෝස්තු දක්වා මාස තුළ දී මිල මට්ටම් පහත වැටෙන අතර අතුරු අස්වනු කාල පරිච්ඡේද වලදී මිල ගණන් ඉහළ යාමක් සිදු වේ. මීට අමතරව, උත්සව සමයේ දී මිල ගණන් ඉහළ යාමේ නැඹුරුවක් පෙන්වන අතර විශේෂයෙන් ම ප්‍රධාන සංස්කෘතික සහ ආගමික උත්සව දෙක පවත්වන අප්‍රේල් සහ දෙසැම්බර් මාසවලදී මිල ඉහළ යාමක් දක්නට ලැබේ. මිල ගණන්වල මෙම නිරීක්ෂිත හැසිරීම 2006 වසරේ දී ද දක්නට ලැබුණු අතර, අස්වනු කාල පරිච්ඡේදයේ දී එළවළු මිල ගණන් සියයට 1-43 අතර පරාසයකින් පහත වැටීමක් සහ අතුරු අස්වනු කාල පරිච්ඡේදය තුළ දී සියයට 1-52 ප්‍රමාණයකින් ඉහළ යාමක් පෙන්නුම් කෙරිණ. එසේම, අනුරූප කාල පරිච්ඡේදවලදී සහල් මිල පිළිවෙලින් සියයට 3-8 ප්‍රමාණයකින් අඩුවීමක් සහ සියයට 1-10 අතර පරාසයකින් වැඩිවීමක් වාර්තා විය.

## පාරිභෝගික මිල දර්ශක

**ජීවන වියදම මැනීමේ නිල මිනුම වන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) 2006 දෙසැම්බර් මාසයේ දී සියයට 19.3 ක ලක්ෂ්‍යමය වෙනස්වීමක් වාර්තා කළ අතර, වසර අවසාන වනවිට වාර්ෂික සාමාන්‍ය උද්ධමනය සියයට 13.7 ක් කරා ළඟා විය.** කො.පා.මි.ද. යේ උප දර්ශක අතුරින් සියයට 62 ක පමණ ඉහළ ම බර තැබීමක් සහිත ආහාර උප දර්ශකය, සමස්ත දර්ශකය මත ප්‍රමුඛ බලපෑම් ඇති කරන ලදී. භූමිතෙල් සහ විදුලිය මිල ගණන් වැඩි කිරීම සහ අයහපත් කාලගුණික තත්ත්ව මත දර මිල ඉහළ යාම හේතු කොටගෙන ඉන්ධන සහ ආලෝකය උප දර්ශකය 2006 වර්ෂයේ දී ඉතා වැඩි අනුපාතයකින් ඉහළ ගියේය. විවිධ භාණ්ඩ උප දර්ශකය ඉහළ යාමේ නැඹුරුවට ප්‍රධාන වශයෙන් බලපෑම් කරන ලද්දේ ප්‍රවාහනය හා සම්බන්ධ භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළට දැමීම සහ මත්පැන්, දුම්කොළ, බෙහෙත් සහ අධ්‍යාපනයට සම්බන්ධ මිල ගණන් ඉහළ දැමීම විය.

**පුළුල් භූගෝලීය ආවරණයක් සහ වඩාත් කාලීන පාරිභෝගික භාණ්ඩ පැසක් (පදනම් වර්ෂ 1995/97) සහිත ශ්‍රී ලංකා පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (ශ්‍රී ලංකා පා.මි.ද.) කො.පා.මි.ද. ට සමාන රටාවක්**

**4.3 සංඛ්‍යා සටහන** **පරිපාලිත මිල වෙනස්වීම් 2005 - 2006**

| අයිතමය | ඒකකය | මිල (දෙසැ.) රුපියල් | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|
| | | 2004 | 2005 | 2006 | 2005/2004 | 2006/2005 |
| සිගරට් (ගෝල්ඩ්ලීෆ්) | එකක් | 9.00 | 10.50 | 11.00 | 16.7 | 4.8 |
| සිගරට් (බ්‍රිස්ටල්) | එකක් | 7.50 | 9.00 | 9.50 | 20.0 | 5.6 |
| පොල් අරක්කු | මි.ලී. 750 | 338.50 | 375.00 | 410.00 | 10.8 | 9.3 |
| අති විශේෂ අරක්කු | " | 290.00 | 345.00 | 360.00 | 19.0 | 4.3 |
| ඩීසල් | ලී. 1ක් | 44.00 | 50.00 | 60.00 | 13.6 | 20.00 |
| භූමිතෙල් | " | 25.50 | 30.50 | 48.00 | 19.6 | 57.4 |
| පෙට්‍රල් | " | 70.00 | 80.00 | 92.00 | 14.3 | 15.0 |
| දැවිතෙල් (1000) | " | 24.70 | 30.70 | 44.40 | 24.3 | 44.6 |
| දැවිතෙල් (1500) | " | 24.30 | 30.30 | 43.30 | 24.7 | 42.9 |
| දැවිතෙල් (3500) | " | 22.00 | 28.00 | 41.00 | 27.3 | 46.4 |
| විදුලිය ගාස්තු -ඒකක ගාස්තු | ඒකක පරාසය 0-30 | 3.00 | 3.00 | 3.00 | 0.0 | 0.0 |
| | 31-60 | 3.70 | 3.70 | 4.70 | 0.0 | 27.0 |
| | 61-90 | 4.10 | 4.10 | 5.10 | 0.0 | 24.4 |
| | 91-180 | 10.60 | 10.60 | 12.10 | 0.0 | 14.2 |
| | 180ට වැඩි | 15.80 | 15.80 | 17.30 | 0.0 | 9.5 |
| විදුලිය ගාස්තු ස්ථාවර | ඒකක පරාසය 0-30 | 30.00 | 30.00 | 60.00 | 0.0 | 100.0 |
| | 31-60 | 30.00 | 30.00 | 90.00 | 0.0 | 200.0 |
| | 61-90 | 30.00 | 30.00 | 120.00 | 0.0 | 300.0 |
| | 91-180 | 30.00 | 30.00 | 180.00 | 0.0 | 500.0 |
| | 180ට වැඩි | 30.00 | 30.00 | 240.00 | 0.0 | 700.0 |
| බස් ගාස්තු | | | | | 15.0 | 16.0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අනුගමනය කළ අතර, 2006 දෙසැම්බර් මාසයේ දී සියයට 17.9 ක ලක්ෂ්‍යමය වෙනස්වීමක් සහ සියයට 9.5 ක වාර්ෂික සාමාන්‍ය වැඩිවීමක් වාර්තා කළේය. ශ්‍රී ලංකා පා.මි. දර්ශකයේ සියයට 71.2 ක බර තැබීමක් සහිත ආහාර, බීම සහ දුම්කොළ පාරිභෝගික පිරිවැය උප කාණ්ඩය, සියයට 17.7 ක පමණ ලක්ෂ්‍යමය වෙනස්වීමක් සටහන් කරමින් දර්ශකයේ සමස්ත වැඩිවීමට ඉහළ ම බලපෑමක් සිදු කළේය. ශ්‍රී ලංකා පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ දෙවන විශාලම බර තැබීමක් සහිත නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන උප දර්ශකය සමස්ත දර්ශකයේ ඉහළ යාමට සැලකිය යුතු බලපෑමක් එල්ල කරමින් එහි උච්චතම වැඩිවීම වාර්තා කළේය. මෙම උප දර්ශකයේ වාර්තා වූ ඉහළ උද්ධමනයට ප්‍රධාන වශයෙන් දායක වූයේ, ගොඩනැගිලි ද්‍රව්‍ය මිල ඉහළ යාම සහ එල්.පී. ගෑස් සහ විදුලිය ගාස්තු මිල ගණන් වැඩිවීමයි. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මගින් බස් ගාස්තු සංශෝධනය කිරීම සහ වැඩි කළ පෙට්‍රල් සහ ඩීසල් මිල ගණන්වලට ප්‍රතිචාර දක්වමින් ප්‍රවාහන මිල දර්ශකය ද සැලකිය යුතු වැඩිවීමක් වාර්තා කළේය. ඒ අතර, අනෙකුත් උප දර්ශක මගින් ජනිත කළ පීඩනය පහළ මට්ටමක පැවැති අතර 2006 වසරේ දී සමස්ත දර්ශකයේ වැඩිවීමට එම උප දර්ශක මගින් වූ දායකත්වය සියයට 5 ටත් වඩා අඩුවිය.

**සියලුම ප්‍රාදේශීය පාරිභෝගික මිල දර්ශක කොළඹ පාරිභෝගිකයන්ගේ සහ ශ්‍රී ලංකා පාරිභෝගික**යන්ගේ මිල දර්ශකවල හැසිරීම අනුගමනය කළ නමුදු කො.පා.මි. දර්ශකයේ උද්ධමන අනුපාතයන්ට වඩා අඩු අනුපාතයන්ගෙන් වැඩිවිය. අනුරාධපුර (අනුරාධපුර පා.මි.ද.), කොළඹ (කොළඹ දි.පා.මි.ද.), මාතලේ (මාතලේ පා.මි.ද.), සහ මාතර (මාතර පා.මි.ද.) දිස්ත්‍රික්ක හතර සඳහා පාරිභෝගික මිල දර්ශක සම්පාදනය කිරීම සඳහා භාවිතා කළ බර තැබීම් ව්‍යුහයන්හි ඇති වෙනස්කම් සහ ප්‍රාදේශීය මිල ගණන් අතර පවතින වෙනස්කම්, මෙම මිල දර්ශකවල නිරීක්ෂිත මන්දගාමී ඉහළ යාමට හේතු විය. මෙම ප්‍රාදේශීය මිල දර්ශක හතරේම වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතයන් සියයට 7.7 සිට සියයට 9.4 ක පරාසයක් තුළ පිහිටමින් වඩා අඩු අගයන් වාර්තා කළ අතර, එහි අවම අගය වූ සියයට 7.7 මාතර දිස්ත්‍රික් පාරිභෝගික මිල දර්ශකයෙන් වාර්තා විය. කොළඹ දිස්ත්‍රික් පාරිභෝගික මිල දර්ශකයේ ආහාර උප කාණ්ඩය සඳහා සියයට 58 ක බර තැබීම හා සැසඳීමේ දී අනුරාධපුර සහ මාතලේ පාරිභෝගික මිල දර්ශක සඳහා සියයට 64 ක පමණ සාපේක්ෂ වැඩි බර තැබීමක් ආහාර උප කාණ්ඩය සඳහා අයිති වීම, මෙම දිස්ත්‍රික්ක දෙකෙහි කොළඹ දිස්ත්‍රික්කයට වඩා ඉහළ උද්ධමන අනුපාතයන් වාර්තා කිරීමට දායක විය. ඉතා අයහපත් කාලගුණික තත්ත්වයන්ට ප්‍රතිචාර දක්වමින් 2006 වසරේ හතරවන කාර්තුවේ දී කොළඹ දිස්ත්‍රික්කයට සාපේක්ෂව අනුරාධපුර සහ මාතලේ දිස්ත්‍රික්කවල එළවළු මිල ගණන් තියුණු ලෙස ඉහළ ගිය අතර, එය මෙම දිස්ත්‍රික්ක දෙකෙන් වාර්තා වූ සාපේක්ෂ ඉහළ උද්ධමනයන්ට සැලකිය යුතු

බලපෑමක් ඇති කළේය. කොළඹ භාණ්ඩ බෙදාහැරීමේ ප්‍රධාන කේන්ද්‍රය වීම හේතු කොටගෙන දිවයිනේ සියලුම ප්‍රදේශ වලින් කොළඹ නගරයට සැපයුම් ගලා ඒම නිසා කොළඹට සාපේක්ෂව නිෂ්පාදන ප්‍රදේශවල මිල ගණන් සැපයුම් තත්ත්ව වෙනස්වීම්වලට දැඩි ලෙස සංවේදීවීම, මෙම තත්ත්වයට හේතු වූවා විය හැකිය.

### තොග මිල දර්ශකය

**ප්‍රාථමික වෙළෙඳපොළ මිල මට්ටම්වල විචලතාවයන් මනිනු ලබන තොග මිල දර්ශකය (තො.මි.ද.), පසුකාලීන සිල්ලර මිල වර්ධනයන් පෙන්නුම් කරමින් පාරිභෝගික මිල දර්ශකවලට, විශේෂයෙන් ම ශ්‍රී ලංකා පාරිභෝගි-යන්ගේ මිල දර්ශකයට සමාන ආකාරයකින් හැසිරුණි.** තොග මිල දර්ශකයේ විචලතාවයන් වැඩි වශයෙන් නිෂ්පාදක මට්ටමේ මිල වර්ධනයන් නියෝජනය කරන බැවින් එය රටෙහි අනාගත උද්ධමනය තක්සේරු කිරීමට ප්‍රයෝජනවත් නිර්ණායකයක් වේ. වසර 2005 දී තොග මිල දර්ශකය පහත වැටීමේ නැඹුරුවක් පෙන්වූවද, 2006 වසරේ ජනවාරි මාසයෙන් පසුව අඛණ්ඩව ඉහළ යමින් දෙසැම්බර් මාසය වනවිට සියයට 17.3 ක ලක්ෂ්‍යමය වෙනස්වීමක් සහ වර්ෂය සඳහා සියයට 11.7 ක පමණ වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතයක් සටහන් කළේය.

**සමස්ත දර්ශකයේ හැසිරීම් රටාවට ප්‍රධානම බලපෑම ඇති කරන මුළු බරතැබීමෙන් සියයට 68 ක් අයත් ආහාර උප කාණ්ඩයේ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2006 වසරේ දී සාපේක්ෂව පහළ අනුපාතයක් පෙන්නුම් කෙරිණ.** වසර තුළ දී සිල්ලර මිල වෙනස්කම්වලට බලපෑම් ඇති කළ සාධක, තොග මිල මට්ටම්වලදී ද දේශීයව නිෂ්පාදිත සහ ආනයනික ආහාර මිල ගණන් මත සමාන ආකාරයකින් බලපෑම් ඇති කරන ලදී. මීට අමතරව, තේ, ගම්මිරිස් වැනි ඇතැම් අපනයනික ආහාර වර්ග සඳහා අන්තර්ජාතික වෙළෙඳපොළහි ඉහළ මිලක් ලැබීම ද ආහාර උප දර්ශකයේ වැඩිවීමට දායක විය. ඒ අතර, සමස්ත බර තැබීමෙන් සියයට 20 ත් වඩා වැඩි නියෝජනයක් ඇති ප්‍රධාන ආහාර වර්ග දෙකක් වන වී සහ පොල්වල මිල ගණන් පහත වැටීම, මිල පීඩනය කිසියම් ප්‍රමාණයකට සීමා වීමට උපකාරී විය. දේශීය ඉන්ධන මිල ඉහළට සංශෝධනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දෙවන විශාලතම බර තැබීම සහිත ඛනිජ තෙල් නිෂ්පාදිත උප දර්ශකය සියයට 27 කින් පමණ ඉහළ ගියේය. රබර් සඳහා වූ ඉල්ලුම වැඩිවීමත් සමග ජනිත වූ ඉහළ අන්තර්ජාතික මිල ගණන් විවිධ භාණ්ඩ උප දර්ශකයේ විචලතාවයට ප්‍රධාන වශයෙන් බලපෑම් ඇති කළ අතර, වසර තුළ දී එම උප දර්ශකය සියයට 33 කින් පමණ වැඩි විය. 2006 වසරේ දී ප්‍රවාහන උපකරණ උප දර්ශකය සියයට 19 ක වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතයක් වාර්තා කිරීම තුළින් ඉහළ ආනයනික යෙදවුම් මිල සහ නැව් කුලී වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස ටයර් සහ බැටරි මිල ගණන් වැඩිවීම විද්‍යමාන වූ අතර, සියයට 11 කින් පමණ මද්‍යසාර උප දර්ශකයේ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය ඉහළ යාම තුළින් මද්‍යසාර පාන මත පැනවූ දේශීය නිපැයුම් බදුවල බලපෑම පෙන්නුම් කෙරිණ. මීට වෙනස්ව, සහනාධාර පිරිනැමීම හේතු කොටගෙන පොහොරවල තොග මිල ගණන් අඩුවීම, මිල මත වූ ඉහළ පීඩනය කිසියම් ප්‍රමාණයකින් පහත වැටීමට උපකාරී විය.

**භාණ්ඩවල ප්‍රභවය පදනම් කොටගෙන කරනු ලබන වර්ගීකරණ යටතේ 2006 වසරේ දී දේශියව නිෂ්පාදිත උප කාණ්ඩයට අනුගතව ආනයන උප කාණ්ඩය ඉහළම වැඩිවීමක් පෙන්නුම් කළ අතර අපනයන උප කාණ්ඩය සාපේක්ෂව පහළ අනුපාතයකින් වැඩි විය.** තොග මිල දර්ශකයේ භාණ්ඩ පැස තුළ සියයට 27 ක පමණ බරතැබීමක් ඇති ආනයන භාණ්ඩ උප කාණ්ඩයේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපෑ සාධක වූයේ, ප්‍රධාන අතරමැදි ආනයන භාණ්ඩය වන ඛනිජ තෙල් නිෂ්පාදනවල ඉහළ අන්තර්ජාතික මිල සහ ප්‍රධාන ආනයනික ආහාර සහ බෙහෙත් වර්ගවල මිල ඉහළ යාමයි. මද්‍යසාර, දුම්කොළ, ටයර් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය වැනි ආහාර සහ ආහාර නොවන ද්‍රව්‍යයන් ඇතුළත් සමස්ත පැස තුළ සියයට 50කටත් වඩා වැඩි නියෝජනයක් සහිත දේශියව නිෂ්පාදිත භාණ්ඩ උප කාණ්ඩය, සාපේක්ෂව අඩු අනුපාතයක් වූ සියයට 11 කින් වැඩි වූ අතර පොල් සහ කොකෝවා මිල පහත වැටීම මීට ප්‍රධාන වශයෙන් හේතු විය.

**භාවිතය අනුව භාණ්ඩ වර්ගීකරණය යටතේ වූ පාරිභෝගික, අතරමැදි සහ ආයෝජන උප දර්ශකවලින් මිල ගණන් ඉහළ යාමට ප්‍රධානතම දායකත්වය අතරමැදි භාණ්ඩවලින් ඇති කෙරිණ.** මෙම උප දර්ශකය පසුගිය වසරේ වාර්තා කළ සියයට 11 ක සාමාන්‍ය වැඩිවීමට සාපේක්ෂව මෙම වසරේ දී සියයට 25 ක පමණ ඉහළ අනුපාතයකින් වැඩි විය. දුම්කොළ සඳහා දේශිය නිපැයුම් බදු පැනවීම, රබර් සඳහා ඉහළ අපනයන මිලක් ලැබීම, ටයර් මිල ඉහළ යාම සහ තිරිඟු ඇටවල ආනයනික මිල ඉහළ යාම වැනි සාධක අතරමැදි භාණ්ඩයන්ගේ මිල ඉහළ යාමට ප්‍රධාන වශයෙන් දායක විය. තොග මිල දර්ශකයේ භාණ්ඩ පැසෙහි සියයට 71 ත් වඩා වැඩි ප්‍රමුඛතම නියෝජනය සහිත වැඩි වශයෙන් ආහාර ද්‍රව්‍යවලින් සමන්විත පාරිභෝගික භාණ්ඩ උප දර්ශකය, ආහාර උප දර්ශකයට බොහෝ දුරට සමාන ආකාරයකින් විචලනය වූ අතර, වසර සඳහා ආහාර උප දර්ශකය වාර්තා කළ උද්ධමන අනුපාතිකයට සමාන උද්ධමන අනුපාතිකයක් වාර්තා කළේය. සාපේක්ෂව අඩු නියෝජනයක් තිබුණ ද ආයෝජන උප කාණ්ඩය සියයට 30 ක පමණ ඉහළ ම වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතිකය සටහන් කළේය. ආනයනික මෙන්ම දේශියව සපයන භාණ්ඩ හා සේවාවල ඉහළ මිල ගණන් හේතු කොටගෙන දේශීය නිෂ්පාදන පිරිවැය ඉහළ යාමට අමතරව ගොඩ-නැගිලි ද්‍රව්‍ය ප්‍රවාහන වියදම් වැඩිවීම ද මෙම මිල වැඩිවීම්

වලට අර්ධ වශයෙන් දායක විය. තවද, පරිසර ආරක්ෂණ හේතූන් මත තහංචි පැනවීමේ ප්‍රතිඵලයක් ලෙස වැලි, ගඩොල් සහ උළු වැනි ඇතැම් ගොඩනැගිලි ද්‍රව්‍යයන්ගේ නිෂ්පාදනය මත අහිතකර බලපෑම් ඇති වූ අතර, එමගින් ඒවායේ සැපයුම සීමාසහිත විය.

### දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය

**ආර්ථිකයේ නිෂ්පාදිත සියලුම භාණ්ඩවල මිල වෙනස්වීම් මනිනු ලබන දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය, 2005 වසරේ සියයට 9.9 ක ඉහළ යාමට සාපේක්ෂව 2006 වසරේ දී සියයට 10.3 ක ඉහළ යාමක් පෙන්වීය.** ඉහළ යන උද්ධමන උපනතීන් කාර්මික සහ සේවා අංශවල නිරීක්ෂණය වූ අතර, කෘෂිකාර්මික අංශය පසුගිය වසරේ වාර්තා කළ සියයට 11 ක වැඩිවීම හා සැසඳීමේ දී සියයට 7.7 ක පමණ තරමක් අඩු අනුපාතයකින් ඉහළ ගියේය. සේවා අංශය, සියයට 11.1 ක පමණ ඉහළම වැඩිවීමක් වාර්තා කළ අතර, කාර්මික අංශය 2005 වසරේ දී සටහන් කළ සියයට 9 ක වැඩිවීමට සාපේක්ෂව සියයට 10.3 ක වැඩිවීමක් වාර්තා කළේය.

## 4.3 වැටුප්

**රැකියාවල නියුතු ජනගහනය, ගෙවීම් ලබන සේවා නියුක්තිකයන්, සේවා යෝජකයන්, ස්වයං රැකියාවල නියුතු වන්නන් හා ගෙවීම් නොලබන පවුලේ සේවකයන්ගෙන් සමන්විත වේ.** ගෙවීම් ලබන සේවා නියුක්තිය රාජ්‍ය අංශය, විධිමත් පෞද්ගලික අංශය හා අවිධිමත් පෞද්ගලික අංශය ලෙස අංශ තුනකි. රාජ්‍ය අංශයේ වැටුප් තීරණය කරනු ලබන්නේ ප්‍රධාන වශයෙන් රජය විසිනි. විධිමත් පෞද්ගලික අංශයේ වැටුප් තීරණය වීමේ ක්‍රියාවලිය කිහිප ආකාරයකට සිදු වේ. එනම් ත්‍රෛපාර්ශ්වික තීරණය කිරීම් මගින්, සාමූහික ගිවිසුම් මගින්, විනිශ්චය සභාවල තීරණ මගින්, ඒකපාර්ශ්වික සේවායෝජකයන්ගේ තීරණ අනුව හා රජය මගින් නියම කරනු ලබන වෙනස් කිරීම් මගිනි. අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් බොහෝවිට තීරණය කරනු ලබන්නේ වෙළෙඳපොළ පවත්නා ඉල්ලුම හා සැපයුම මත වේ. වසර 2006 දී පෙර වසරවලට වඩා වැඩි වර්ධනයක් මූර්ත වැටුප්වල දක්නට ලැබුණි.

**4.4 සංඛ්‍යා සටහන** දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය

| අංශය | දර්ශකය | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|
| | 2004 | 2005(අ) | 2006(ආ) | 2005/04 | 2006/05(ආ) |
| කෘෂිකාර්මික | 182.3 | 202.4 | 217.9 | 11.0 | 7.7 |
| කාර්මික | 185.9 | 202.6 | 223.4 | 9.0 | 10.3 |
| සේවා | 183.0 | 201.2 | 223.6 | 10.0 | 11.1 |
| ද.දේ.නි. | 183.6 | 201.8 | 222.6 | 9.9 | 10.3 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### රාජ්‍ය අංශයේ වැටුප්[2]

**රජය විසින් 2006 අය-වැය යෝජනා වලට අනුව රාජ්‍ය සේවය නැවත වර්ගීකරණයක් හා කාණ්ඩ කිරීමක් කර, සියලුම සේවා හා තනතුරු සඳහා නව අර්ථ දැක්වීමක් පදනම් කර ගනිමින් නව වැටුප් ව්‍යුහයක් ක්‍රියාත්මක කරන ලදී.** මේ අනුව සියලුම රාජ්‍ය සේවකයන් සඳහා 2005 දෙසැම්බර් මස ඔවුන් ලැබූ සියලු දීමනා සමග වැටුප් හා නව පරිමාණයේ වැටුප් අතර වෙනසින් සියයට 50 ක වැටුප් ඉහළ යාමක් 2006 ජනවාරි 01 වැනි දින සිට ලබාදුනි. ඉතිරි සියයට 50 ක වෙනස 2007 ජනවාරි මස සිට ගෙවිය යුතු වේ.

**රාජ්‍ය සේවකයන් සඳහා නව ජීවන වියදම් දීමනාවක් ද 2006 අය-වැය යෝජනා අනුව ක්‍රියාත්මක කරන ලදී.** ඒ අනුව, මෙම ජීවන වියදම් දීමනාව හය මසකට වරක්

**4.5 සංඛ්‍යා සටහන** වැටුප් පරිමාණ දර්ශක (1978 දෙසැම්බර් = 100)

| සේවක කාණ්ඩ | දර්ශකය | | | | | | ප්‍රතිශත වෙනස | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නාමික | | | මූර්ත | | | නාමික | | | මූර්ත | | |
| | 2004 | 2005 | 2006(අ) | 2004 | 2005 | 2006(අ) | 2004 | 2005 | 2006(අ) | 2004 | 2005 | 2006(අ) |
| 1. රජයේ සේවකයන් | | | | | | | | | | | | |
| මධ්‍යම රජයේ සේවකයන් | 1,872.1 | 2,417.5 | 3,155.6 | 123.3 | 142.7 | 164.2 | 22.8 | 29.1 | 30.5 | 14.0 | 15.8 | 15.1 |
| විධායක නොවන | 1,709.0 | 2,178.4 | 2,853.8 | 112.5 | 128.6 | 148.5 | 21.2 | 27.5 | 31.0 | 12.6 | 14.3 | 15.5 |
| සුළු සේවකයන් | 2,039.5 | 2,672.4 | 3,474.1 | 134.3 | 157.8 | 180.8 | 24.6 | 31.0 | 30.0 | 15.7 | 17.5 | 14.6 |
| රජයේ පාසැල් ගුරුවරුන් | 1,428.4 | 1,818.6 | 2,304.2 | 94.1 | 107.4 | 119.9 | 21.0 | 27.3 | 26.7 | 12.4 | 14.1 | 11.7 |
| 2. පඩිපාලක සභාවලට අයත් කම්කරුවන් | | | | | | | | | | | | |
| සියලුම පඩිපාලක සභාවලට අයත් කම්කරුවන් | 1,233.0 | 1,329.7 | 1,358.2 | 81.3 | 78.5 | 70.7 | 2.3 | 7.8 | 2.1 | -4.8 | -3.5 | -9.9 |
| කෘෂිකර්මාන්තයෙහි නියැලුණු කම්කරුවන් | 1,397.7 | 1,527.4 | 1,567.1 | 92.2 | 90.2 | 81.6 | 1.1 | 9.3 | 2.6 | -5.9 | -2.3 | -9.5 |
| කර්මාන්ත හා වාණිජ කටයුතුවල නියැලුණු කම්කරුවන් | 1,044.1 | 1,078.4 | 1,090.7 | 68.9 | 63.7 | 56.8 | 3.4 | 3.3 | 1.1 | -3.7 | -7.6 | -10.8 |
| සේවා අංශයෙහි කම්කරුවන් | 751.0 | 779.7 | 779.7 | 49.5 | 46.0 | 40.6 | 10.8 | 3.8 | 0.0 | 2.9 | -7.0 | -11.8 |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව
කම්කරු දෙපාර්තමේන්තුව

[2] රාජ්‍ය අංශයේ සේවකයන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම්, රාජ්‍ය (මධ්‍යම රජයේ, පළාත් සභා හා පළාත් පාලන ආයතන) හා අර්ධ රාජ්‍ය (රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රාජ්‍ය අධිකාරීන් ) වේ.

**4.6 සංඛ්‍යා සටහන**

## ක්ෂේත්‍රය හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව අසංවිධිත පෞද්ගලික අංශයේ දෛනික වැටුප්(අ)

| අංශය | වාර්ෂික සාමාන්‍යය (රු.) | | | ප්‍රතිශත වෙනස | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | නාමික | | මූර්ත | |
| | 2004 | 2005 | 2006(ආ) | 2005 | 2006(ආ) | 2005 | 2006(ආ) |
| 1. කෘෂිකාර්මික අංශය | | | | | | | |
| තේ | | | | | | | |
| පුරුෂ | 304 | 300 | 333 | -1.3 | 11.2 | -12.9 | -2.5 |
| ස්ත්‍රී | 218 | 217 | 234 | -0.5 | 8.4 | -12.1 | -5.3 |
| රබර් | | | | | | | |
| පුරුෂ | 304 | 305 | 335 | 0.8 | 9.7 | -10.8 | -4.0 |
| ස්ත්‍රී | 229 | 230 | 249 | 1.3 | 8.3 | -10.3 | -5.4 |
| පොල් (ඇ) | | | | | | | |
| පුරුෂ | 361 | 378 | 411 | 5.0 | 8.6 | -6.6 | -5.1 |
| වී | | | | | | | |
| පුරුෂ | 334 | 343 | 375 | 2.4 | 9.8 | -9.2 | -3.9 |
| ස්ත්‍රී | 256 | 256 | 289 | -0.1 | 13.4 | -11.7 | -0.3 |
| 2. ඉදිකිරීම් අංශය (ඇ) | | | | | | | |
| වඩුකාර්මික | | | | | | | |
| වඩුකාර්මික - පිරිමි | 505 | 542 | 616 | 7.4 | 13.4 | -4.2 | -0.3 |
| පුහුණු හා නුපුහුණු අත්උදව්කරුවන් - පිරිමි | 349 | 353 | 398 | 1.3 | 12.7 | -10.3 | -1.0 |
| පෙදරේරු | | | | | | | |
| පෙදරේරු - පිරිමි | 499 | 537 | 608 | 7.6 | 13.1 | -4.0 | -0.6 |
| පුහුණු හා නුපුහුණු අත්උදව්කරුවන් - පිරිමි | 347 | 353 | 394 | 1.8 | 11.8 | -9.8 | -1.9 |

(අ) වැටුප් විස්තර මධ්‍යස්ථාන 93 ක මාසික වැටුප් පදනම්කොට ගෙන සකස් කර ඇත.
(ආ) තාවකාලික
(ඇ) පොල්වගා සහ ඉදිකිරීම් අංශවල කාන්තා සහභාගීත්වය පහළ මට්ටමක පවතී.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

එනම්, එක් එක් වර්ෂයේ ජුනි මස 30 හා දෙසැම්බර් මස 31 වන දින සංශෝධනය කිරීමට නියමිතය. මෙම ජීවන වියදම් දීමනාවේ මූලික ගෙවීම ලෙස රු.1,000 ක මුදලක් සියලුම රාජ්‍ය සේවකයන් හට 2006 ජනවාරි 01 වැනිදා සිට ලබාදුන් අතර එය රු.1,375 දක්වා 2006 ජූලි මස 01 වැනිදා සිට වැඩි කරන ලදී (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 12/2006). ඉහත දක්වන ලද 2006 වසරේ දී වැටුප් වැඩි කිරීමේ සාමූහික ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය අංශයේ විධායක නොවන නිලධාරීන්ගේ, සුළු සේවකයන්ගේ හා පාසල් ගුරුවරුන්ගේ වැටුප් දර්ශකවල සියයට 26-31 පරාසයකින් ඉහළ යාමක් ඇති විය. මෙම නාමික වැටුප් වැඩිවීම උද්ධමනය හා ගලපන විට ඒවායේ මූර්ත වැටුප් වැඩිවීම සියයට 12-16 අතර පරාසයක විය.

### විධිමත් පෞද්ගලික අංශයේ වැටුප්[3]

**සමස්තයක් ලෙස විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ 2006 වසරේ දී අවම නාමික වැටුප් දර්ශක අගයන් සියයට 2 කින් පමණ ඉහළ ගියේය.** කෘෂිකාර්මික හා කර්මාන්ත සහ වාණිජ අංශවල සේවකයන්ගේ වැටුප් සියයට 1-3 ක පරාසයකින් ඉහළ ගිය අතර, සේවා අංශයේ සේවකයන්ගේ වැටුප්වල වෙනසක් සිදු නොවීය. විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වැඩිවීම ඒකපුද්ගල ගිවිසුම්, සාමූහික එකඟතා, සේවායෝජකයන්ගේ ඒකපාර්ශ්වීය තීරණ හා පඩි පාලක සභාවලින් තීරණය වන අවම වැටුප් මට්ටම් ආදිය මත තීරණය වේ. මෙම අංශයේ සේවකයන්ට වසර 2005 දී මෙන් ම 2006 වසරේ දී ද අවම මූර්ත වැටුප් මට්ටම්වල තවදුරටත් අඩුවීමක් අත්විඳීමට සිදු විය. කෙසේ වෙතත් අවම වැටුප් දර්ශක මගින් කළමනාකරණ හා වෘත්තීමය කාණ්ඩවල සියලුම ගෙවීම් හා වැටුප් ඇතුළත් ඉපැයීම් ආවරණය නොවන අතර, සත්‍ය තත්ත්වය මෙම අවම වැටුප් දර්ශකවලින් පෙන්නුම් කරන ස්වරූපයට වඩා වෙනස් විය හැකිය.

### අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප්[4]

**අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් දර්ශකවල සුළු වැඩි දියුණුවීමක් 2006 දී පෙන්නුම් කරයි.** ශ්‍රී ලංකා මහ බැංකුවේ ''දීපදත්ත'' - දීපව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩසටහනට අනුව කෘෂිකාර්මික අංශය සඳහා නාමික දෛනික වැටුප් සියයට 8-13 ක පරාසයකින් වසර 2006 දී වැඩි වී ඇත. තේ හා රබර් අංශවල සේවකයන්ගේ වැටුප් දර්ශකයන් සාපේක්ෂව ඉහළ අගයක් දක්වන අතර, එය තේ හා රබර්වල මිල ගණන්වල වැඩිවීමේ ප්‍රතිඵලයක් වේ. කෙසේ වෙතත්, කෘෂිකාර්මික අංශයේ මූර්ත වැටුප් දර්ශකයන් පසුගිය වසරේ සිදු වූ සියයට 6.6-12.9

[3]ප්‍රධාන අර්ථසාධක අරමුදල (EPF) හෝ කම්කරු කොමසාරිස්වරයාගේ අනුමැතිය ඇතිව පෞද්ගලිකව පවත්වාගෙන යනු ලබන අර්ථසාධක අරමුදලකට හෝ ආයක මුදල් ගෙවනු ලබන පෞද්ගලික අංශයේ සේවකයන් විධිමත් පෞද්ගලික අංශයට ගැනේ.
[4]රාජ්‍ය අංශයට හා විධිමත් පෞද්ගලික අංශයට නොවැටෙන සියලුම සේවකයන්ගෙන් අවිධිමත් පෞද්ගලික අංශය සමන්විත වේ.

පරාසයක පහළ බැසීම හා සසඳන විට 2006 දී සියයට 0.3 සිට 5.4 දක්වා පරාසයකින් තවදුරටත් පහළ බැස ඇත. ඉදිකිරීම් අංශයේ ඇති වූ සේවක ඉල්ලුම තවදුරටත් පැවැතීම නිසා එම අංශයේ නාමික වැටුප් දර්ශක 2006 වර්ෂයේ දී සියයට 12-13 ක පරාසයකින් ඉහළ යාමක් සිදු විය. කෙසේ වෙතත්, මෙය උද්ධමනය හා ගැලපීමේ දී ඔවුන්ගේ මූර්ත වැටුප අදාල වසර තුළ දී සුළු වශයෙන් පහළ ගොස් ඇත.

## 4.4 ජනගහනය, ශ්‍රම බලකාය හා සේවා නියුක්තිය

### ජනගහනය

**මධ්‍ය වාර්ෂික ජනගහනය 2006 වර්ෂයේ දී දළ ලක්ෂ 19.9 ක් වූ අතර, මෙය 2005 වර්ෂයට වඩා සියයට 1.1 ක වර්ධනයකි.** වයස් කාණ්ඩ තුනෙහි ම (අවු. 15 ට අඩු, අවු. 15-54 හා අවු. 55 ට වැඩි) වර්ධන අනුපාත මධ්‍ය වාර්ෂික ජනගහන වර්ධන අනුපාතයට සමාන විය. යාපනය හා කිලිනොච්චිය හැර අන් සෑම දිස්ත්‍රික්කයක් ම ජනගහන වර්ධනය සඳහා දායක වූ අතර ජනගහන සංක්‍රමණය නිසා එම දිස්ත්‍රික්ක දෙකෙහි ජනගහනයේ අඩුවීමක් දක්නට ඇත. ඉහළ ජනගහන වර්ධනයන් වාර්තා වූ කොළඹ, වවුනියාව, මහනුවර, ගම්පහ, රත්නපුර, කුරුණෑගල, බදුල්ල හා ගාල්ල යන දිස්ත්‍රික්කයන්හි ජනගහනයෙහි සිදුවූ වැඩිවීම මුළු ජනගහන වර්ධනයෙන් සියයට 63 කට දායක විය.

**4.7 සංඛ්‍යා සටහන** දිස්ත්‍රික්ක මට්ටමින් ජනගහනය

පුද්ගලයින් '000

| දිස්ත්‍රික්කය | 2005 | 2006 (අ) | වෙනස | වෙනස (%) |
|---|---|---|---|---|
| කොළඹ | 2,382 | 2,421 | 39 | 1.6 |
| මහනුවර | 1,343 | 1,361 | 18 | 1.3 |
| රත්නපුරය | 1,060 | 1,073 | 13 | 1.2 |
| බදුල්ල | 825 | 837 | 12 | 1.5 |
| කුරුණෑගල | 1,498 | 1,511 | 13 | 0.9 |
| ගම්පහ | 2,111 | 2,125 | 14 | 0.7 |
| ගාල්ල | 1,030 | 1,040 | 10 | 1.0 |
| අනුරාධපුරය | 782 | 791 | 9 | 1.2 |
| කළුතර | 1,094 | 1,102 | 8 | 0.7 |
| මාතර | 795 | 804 | 9 | 1.1 |
| නුවරඑළිය | 729 | 735 | 6 | 0.8 |
| අම්පාර | 618 | 627 | 9 | 1.5 |
| මඩකලපුව | 549 | 556 | 7 | 1.3 |
| පුත්තලම | 737 | 745 | 8 | 1.1 |
| යාපනය | 603 | 595 | -8 | -1.3 |
| මාතලේ | 466 | 471 | 5 | 1.1 |
| ත්‍රිකුණාමලය | 388 | 395 | 7 | 1.8 |
| හම්බන්තොට | 542 | 547 | 5 | 0.9 |
| මොණරාගල | 415 | 420 | 5 | 1.2 |
| පොළොන්නරුව | 377 | 382 | 5 | 1.3 |
| මුලතිව් | 141 | 145 | 4 | 2.8 |
| කිලිනොච්චිය | 145 | 142 | -3 | -2.1 |
| වව්නියාව | 145 | 164 | 19 | 13.1 |
| කෑගල්ල | 794 | 797 | 3 | 0.4 |
| මන්නාරම | 99 | 100 | 1 | 1.0 |
| එකතුව | 19,668 | 19,886 | 218 | 1.1 |


(අ) තාවකාලික

මූලය: රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ශ්‍රම බලකාය

**ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය, සේවා නියුක්තිය හා සේවා වියුක්තිය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණවලදී ඇස්තමේන්තු කරනු ලැබේ[5].** සුනාමි ඛේදවාචකය බලපෑ ප්‍රදේශවලින් නියැදි ආවරණ නොලැබූ නිසා 2005 වර්ෂයේ දී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයන් නොපැවැත්වුව ද 2005 අගෝස්තු මාසයේ දී මුළු රට ම ආවරණය වන පරිදි විශේෂ ශ්‍රම බලකා සමීක්ෂණයක් පවත්වන ලදී. 2006 වර්ෂයේ දී කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයන් පවත්වන ලද නමුදු, අහිතකර ආරක්ෂක තත්ත්වය හේතුවෙන් උතුරු හා නැගෙනහිර පළාත් එම සමීක්ෂණයන්හි දී ආවරණය නොවුනි. ඒ නිසා 2005 හා 2006 වර්ෂ සඳහා සංසන්දනාත්මක දත්ත ශ්‍රේණි නොමැති බැවින් 2005 වර්ෂයට සාපේක්ෂව 2006 වර්ෂයේ කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයේ හා 2005 වර්ෂයේ පැවැත්වූ විශේෂ ශ්‍රම බලකා සමීක්ෂණයේ දත්ත සඳහා ද උතුරු හා නැගෙනහිර පළාත් අඩංගු නොකර අදාල ගැලපීම් සිදු කරන ලදී. මෙම ගැලපීම් සිදු කළ දත්ත ඉතා ම ආසන්න අගයන් ලෙස භාවිතා කළ හැකිය. ඒ අනුව 2005 අගෝස්තු මාසයේ දී දළ ලක්ෂ 7.3 ක් වූ ශ්‍රම බලකාය 2006 දී දළ ලක්ෂ 7.6 දක්වා සියයට 3.9 කින් ඉහළ නැගුණු අතර මෙය සේවා නියුක්තිකයින් දළ ලක්ෂ 7.1 කින් හා සේවා වියුක්තිකයින් දළ ලක්ෂ 0.5 කින් සමන්විත විය. මෙම කාල පරිච්ඡේදවල දී ම ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය ද සියයට 49.3 සිට සියයට 51.2 දක්වා ඉහළ යෑමක් පෙන්නුම් කෙරිණි.[6]

**4.3 රූප සටහන** ශ්‍රම බලකාය සහ විරැකියාවේ ප්‍රවණතාවයන් 2002-2006




[5]වයස අවුරුදු 10 ට වැඩි නිශ්චිත කාලසීමාවක දී රැකියාවක් කිරීමට හැකි හා කැමති පුද්ගලයින් ශ්‍රම බලකාය ලෙස හැඳින්වේ.

[6]ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය යනු ශ්‍රම බලකාය, අවු.10 ට වැඩි කුටුම්බ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස දැක්වීමයි.

**4.8 සංඛ්‍යා සටහන**

**කුටුම්භ ජනගහනය, ශ්‍රම බලකාය සහ ශ්‍රම බලකා සහභාගිත්වය**

| ශීර්ෂය | 2004(අ) | 2005 (ආ) | 2005 (ආ,ඇ) | 2006 (ඇ) පළමු කාර්තුව | 2006 (ඇ) දෙවන කාර්තුව | 2006 (ඇ) තෙවන කාර්තුව | 2006 (ඇ) සිව්වන කාර්තුව | 2006 (ඇ) වාර්ෂික |
|---|---|---|---|---|---|---|---|---|
| කුටුම්භ ජනගහනය (ඈ) පුද්ගලයන් .000 | 16,593 | 16,871 | 14,838 | 14,759 | 14,779 | 14,989 | 14,967 | 14,834 |
| ශ්‍රම බලකාය පුද්ගලයන් .000 | 8,061 | 8,141 | 7,312 | 7,628 | 7,549 | 7,602 | 7,629 | 7,599 |
| සේවා නියුක්ත | 7,394 | 7,518 | 6,788 | 7,081 | 7,074 | 7,112 | 7,150 | 7,105 |
| සේවා වියුක්ත | 667 | 623 | 524 | 546 | 476 | 490 | 479 | 493 |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (ඉ) % | 48.6 | 48.3 | 49.3 | 51.7 | 51.1 | 50.7 | 51.0 | 51.2 |
| පුරුෂ | 66.7 | 67.1 | 67.3 | 69.3 | 68.4 | 68.0 | 67.0 | 68.1 |
| ස්ත්‍රී | 31.5 | 30.9 | 32.6 | 35.5 | 35.4 | 35.0 | 36.1 | 35.7 |

(අ) 2004 වාර්ෂික ඇස්තමේන්තු සඳහා මුලතිව් සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක ඇතුළත් කර නොමැත.
(ආ) 2005 වර්ෂයේ කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය එක්වරක් පමණක් අගෝස්තු මාසයේ දී පවත්වන ලදී.
(ඇ) උතුරු හා නැගෙනහිර පළාත් ශ්‍රම බලකා සමීක්ෂණයට ඇතුළත් කර නොමැත.
(ඈ) වයස අවු. 10 සහ ඊට වැඩි කුටුම්භ ජනගහනය
(ඉ) ශ්‍රම බලකාය කුටුම්භ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## සේවා නියුක්තිය

කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව 2005 වර්ෂයේ අගෝස්තු මාසයේ දී දශ ලක්ෂ 6.8 ක් වූ සේවා නියුක්තිකයින් සංඛ්‍යාව 2006 වර්ෂයේ දී දශ ලක්ෂ 7.1 දක්වා සියයට 4.7 කින් ඉහළ නැගුනි. කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව යම් පුද්ගලයකු පැයක් හෝ ඊට වැඩි කාල ප්‍රමාණයක් ගෙවීමකට, යම් ලාභයක් ඉපැයීම සඳහා හෝ ගෙවීමක් නොලබා පවුලේ වැඩ කටයුත්තකට සමීක්ෂණය සිදු කරන දවසේ සිට සතියකට ප්‍රථම කාල පරිච්ඡේදය තුළ යෙදෙයි නම් එම පුද්ගලයා සේවා නියුක්තිකයෙකු ලෙස හැඳින්වේ. අසනීපයෙන් පසු වූ නිසා, අයහපත් කාලගුණය නිසා හෝ කාර්මික ආරාවුල් නිසා තාවකාලිකව සේවයට වාර්තා නොකළ ද එම පුද්ගලයින් සේවා නියුක්තිකයන් ලෙස සැලකේ.

සේවා නියුක්තියේ ඉහළ යාම කෘෂිකර්ම, කර්මාන්ත හා සේවා යන ආර්ථික අංශ තුන තුළ ම පැතිරී ඇත. කර්මාන්ත අංශයේ සේවා නියුක්තියේ වැඩි ම ඉහළ යෑමක් වාර්තා වන අතර, සතුටුදායක කෘෂිකාර්මික මිල ගණන් හා සහනාධාර වැඩසටහන් කිහිපයක් අනුයුක්ත කිරීම ඇතුළු රජයේ ප්‍රතිපත්ති පුළුල් කිරීම හේතුවෙන් කෘෂිකර්ම අංශයේ සේවා නියුක්තිය ඉහළ යෑමක් සිදුවිය. එසේ වුවද සේවා අංශයේ සේවා නියුක්තිය සියයට 0.4 ක් ආන්තික වශයෙන් පහළ ගිය අතර සේවා අංශයේ දළ දේශීය නිෂ්පාදිතයේ ඉහළ වර්ධනයක් අදාල කාල

**4.9 සංඛ්‍යා සටහන**

**ආර්ථික ක්‍රියාකාරිත්වය අනුව සේවා නියුක්තිය**

| අංශය | පුද්ගලයන් '000 | | | | | | | | මුළු සේවා නියුක්තියේ ප්‍රතිශතය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2006 (ඇ) | | | | | | | | |
| | 2004 (අ) | 2005 (ආ) | 2005 (ආ) (ඇ) | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික | 2004 (අ) | 2005 (ආ) | 2005 (ආ) (ඇ) | 2006 (ඇ) |
| කෘෂිකර්මය | 2,475 | 2,306 | 2,059 | 2,346 | 2,423 | 2,122 | 2,357 | 2,287 | 33.5 | 30.7 | 30.3 | 32.2 |
| කර්මාන්ත | 1,781 | 1,928 | 1,787 | 1,863 | 1,791 | 2,018 | 1,892 | 1,890 | 24.1 | 25.6 | 26.3 | 26.6 |
| නිමැවුම් කර්මාන්ත | 1,307 | 1,385 | 1,293 | 1,333 | 1,250 | 1,486 | 1,357 | 1,363 | 17.7 | 18.4 | 19.0 | 19.2 |
| ඉදිකිරීම් (ඈ) | 474 | 543 | 494 | 530 | 541 | 532 | 535 | 527 | 6.4 | 7.2 | 7.3 | 7.4 |
| සේවා | 3,138 | 3,284 | 2,941 | 2,872 | 2,860 | 2,972 | 2,901 | 2,928 | 42.4 | 43.7 | 43.3 | 41.2 |
| වෙළඳාම සහ හෝටල් ආදිය | 1,031 | 1,043 | 932 | 1,101 | 1,034 | 1,088 | 1,043 | 1,084 | 13.9 | 13.9 | 13.7 | 15.3 |
| ප්‍රවාහන, ගබඩා කිරීම සහ සන්නිවේදනය | 417 | 485 | 448 | 404 | 404 | 438 | 439 | 430 | 5.6 | 6.5 | 6.6 | 6.1 |
| මූල්‍ය, රක්ෂණ සහ නිශ්චල දේපල | 176 | 234 | 226 | 236 | 213 | 244 | 196 | 221 | 2.4 | 3.1 | 3.3 | 3.1 |
| පෞද්ගලික සේවා සහ අදාළ වෙනත් සේවා | 1,514 | 1,522 | 1,335 | 1,131 | 1,209 | 1,203 | 1,223 | 1,192 | 20.5 | 20.2 | 19.7 | 16.8 |
| **මුළු සේවා නියුක්තිය** | **7,394** | **7,518** | **6,788** | **7,081** | **7,074** | **7,112** | **7,150** | **7,105** | **100.0** | **100.0** | **100.0** | **100.0** |
| **ශ්‍රම බලකායේ ප්‍රතිශතය** | **91.7** | **92.3** | **92.8** | **92.8** | **93.7** | **93.6** | **93.7** | **93.5** | - | - | - | - |

(අ) 2004 වාර්ෂික ඇස්තමේන්තු සඳහා මුලතිව් සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක ඇතුළත් කර නොමැත.
(ආ) 2005 වර්ෂයේ කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය එක් වරක් පමණක් අගෝස්තු මාසයේ දී පවත්වන ලදී.
(ඇ) උතුරු හා නැගෙනහිර පළාත් ශ්‍රම බලකා සමීක්ෂණයට ඇතුළත් කර නැත.
(ඈ) පතල් හා කැනීම්, විදුලිය ගෑස් සහ ජලය උප අංශ ඉදිකිරීම් යටතේ වර්ගීකරණය කර ඇති අතර 2004 හා 2005 දත්ත ඒ අනුව සංශෝධනය කර ඇත.

මූලය: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**4.10 සංඛ්‍යා සටහන**

**සේවා නියුක්ති මූලයන්**

ප්‍රතිශතය

| වර්ෂය | රාජ්‍ය අංශයේ සේවකයින් | පෞද්ගලික අංශයේ සේවකයින් | සේව්‍යයන් | ස්වයං රැකියාවන්හි නියුතු වූවන් | ගෙවීමක් නොලද පවුලේ සේවකයින් | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2004 (අ) | 13.0 | 46.4 | 2.9 | 28.3 | 9.4 | 100 |
| 2005 (ආ) | 13.3 | 46.1 | 3.1 | 29.7 | 7.9 | 100 |
| 2005 (ආ) (ඇ) | 13.2 | 46.2 | 2.8 | 29.7 | 8.1 | 100 |
| **2006 (ඇ)** | **13.4** | **42.1** | **3.1** | **30.8** | **10.5** | **100** |
| පළමු කාර්තුව | 13.4 | 41.9 | 3.2 | 31.6 | 9.9 | 100 |
| දෙවන කාර්තුව | 13.4 | 42.0 | 3.0 | 30.6 | 11.1 | 100 |
| තෙවන කාර්තුව | 14.0 | 42.1 | 3.6 | 30.1 | 10.2 | 100 |
| සිව්වන කාර්තුව | 13.1 | 42.8 | 3.0 | 30.5 | 10.6 | 100 |

(අ) 2004 වාර්ෂික ඇස්තමේන්තු සඳහා මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික්ක ඇතුළත් කර නොමැත.
(ආ) 2005 වර්ෂයේ කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය එක් වරක් පමණක් අගෝස්තු මාසයේ දී පවත්වන ලදී.
(ඇ) උතුරු සහ නැගෙනහිර පළාත් ශ්‍රම පලකා සමීක්ෂණයට ඇතුළත් කර නොමැත.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

පරිච්ඡේදය තුළ වාර්තාවුනි. සේවා අංශයේ සේවා නියුක්තියේ මෙම පහළ බැසීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ අදාල කාල පරිච්ඡේද දෙක අතර, පුද්ගලික සේවා හා අදාල වෙනත් සේවා යන උප කාණ්ඩයන්හි සේවා නියුක්තිය දශ ලක්ෂ 1.3 සිට දශ ලක්ෂ 1.2 දක්වා පහළ බැසීමය.

**කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව පුද්ගලික අංශයේ සේවා නියුක්තියේ දායකත්වය 2005 වර්ෂයේ අගෝස්තු මාසයේ වූ සියයට 46.2 සිට 2006 වර්ෂයේ දී සියයට 42.1 දක්වා පහළ යෑමක් සිදු විය.** රාජ්‍ය අංශයේ සේවා නියුක්ති දායකත්වය 2005 අගෝස්තු මස වූ සියයට 13.2 සිට 2006 දී සියයට 13.4 දක්වා ඉහළ යෑමක් සිදු වී ඇත. අදාල කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පවත්වන ලද රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ වාර්ෂික සමීක්ෂණයේ ද රාජ්‍ය අංශයේ සේවා නියුක්තියේ ප්‍රසාරණයක් පිළිබිඹු විය.

## සේවා වියුක්තිය

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව 2005 අගෝස්තු මස දී සියයට 7.2 ක් වූ සේවා වියුක්ති අනුපාතිකය 2006 වර්ෂය තුළ දී සියයට 6.5 දක්වා පහත වැටුණි.** කෙසේ වෙතත්, 2006 වසරේ තුන්වන කාර්තුවේදී සියයට 6.4 ක්වූ සේවා වියුක්ති අනුපාතිකය

**4.11 සංඛ්‍යා සටහන**

**රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය**

| | 2004 | 2005 | 2006(අ) | ප්‍රතිශත වෙනස 2005/ 2004 | ප්‍රතිශත වෙනස 2006/ 2005(අ) |
|---|---|---|---|---|---|
| රාජ්‍ය (ආ) | 842,255 | 850,321 | 887,674 | 0.9 | 4.4 |
| අර්ධ රාජ්‍ය (ඇ) | 252,659 | 253,922 | 258,049 | 0.5 | 1.6 |
| සමස්ත රාජ්‍ය අංශය | 1,094,914 | 1,104,243 | 1,145,723 | 0.8 | 3.8 |

(අ) තාවකාලික
(ආ) මධ්‍යම රජය, පළාත් සභා හා ප්‍රාදේශීය සභා
(ඇ) රාජ්‍ය සංස්ථා, මණ්ඩල සහ අධිකාරීන්

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

හතරවන කාර්තුවේදී සියයට 6.3 ක් දක්වා පහත වැටුණි. මෙම පහත වැටීම සඳහා 2006 වර්ෂය තුළ දී ආර්ථිකයේ ප්‍රධාන අංශ තුනෙහිම හිතකර වර්ධනයක් පැවැතීම ඉවහල් විය. තව ද රැකියා උත්පාදනය සඳහා වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කිරීම, ශ්‍රම වෙළෙඳපොළ පිළිබඳ තොරතුරු ව්‍යාප්තවීම සහ වෘත්තීය මග පෙන්වීම් පිළිබඳ වැඩසටහන් පැවැත්වීම ද සේවා වියුක්ති ප්‍රමාණය අඩුවීම සඳහා ඉවහල් විය. සමස්ත සේවා වියුක්ති අනුපාතිකය සියයට 6.5 වුවද වයස් කාණ්ඩ, පළපුරුද්ද හා ප්‍රදේශය අනුව එහි සැලකිය යුතු වෙනස්කම් පැවැතුනි.

**තරුණ වයස් කාණ්ඩ හා කාන්තාවන් අතර සේවා වියුක්තිය අනෙක් වයස් කාණ්ඩ හා පුරුෂයන්ට වඩා සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පැවතුණි.** කෙසේ වුවද, යොවුන් අය අතර, විශේෂයෙන් ම වයස අවු. 15-19 අතර පුද්ගලයන්ගේ සේවා වියුක්තිය අදාල කාල පරාසය තුළ සැලකිය යුතු ලෙස පහත වැටුණි. කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයේ ඇස්තමේන්තුවලට අනුව මෙම වයස් කාණ්ඩ අතරේ සේවා වියුක්ති අනුපාතිකය 2005 අගෝස්තු මාසයේ වූ සියයට 33.2 සිට 2006 වසරේ දී සියයට 23.1 දක්වා පහත වැටුණු අතර අවු. 20 හා අවු. 29 අතරේ සේවා වියුක්තිය නොවෙනස්ව පැවැතුනි. තවද අ.පො.ස. (සා.පෙළ), අ.පො.ස. (උ.පෙළ) හා ඊට ඉහළ අධ්‍යාපන මට්ටම්වල වූ තරුණයින් අතරේ සේවා වියුක්ති අනුපාතිකයන් සියයට 10.6 හා 12.2 සිට පිළිවෙලින් සියයට 9.9 හා සියයට 11.6 ලෙසට එම කාල පරාසයේ දී ම පහත වැටුණි. 2006 වසරේ කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයන් උතුරු හා නැගෙනහිර පළාත්වල නොපැවැත්වූ බැවින්, අවුරුදු දෙකෙහිම ඇස්තමේන්තුවල උතුරු හා නැගෙනහිර පළාත් ඇතුළත් නොවේ.

## විදේශ සේවා නියුක්තිය

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ගණනය කිරීම්වලට අනුව දශ ලක්ෂ 1.5 ක ශ්‍රී ලාංකිකයින් 2006**

**4.12 සංඛ්‍යා සටහන**

**සේවා වියුක්ති අනුපාතිකය (ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස)**

| ශීර්ෂය | 2004(අ) | 2005(ආ) | 2005 (ආ)(ඇ) | 2006(ඇ) පළමු කාර්තුව | 2006(ඇ) දෙවන කාර්තුව | 2006(ඇ) තෙවන කාර්තුව | 2006(ඇ) සිව්වන කාර්තුව | 2006(ඇ) වාර්ෂික |
|---|---|---|---|---|---|---|---|---|
| සමස්ත | 8.3 | 7.7 | 7.2 | 7.2 | 6.3 | 6.4 | 6.3 | 6.5 |
| ස්ත්‍රී පුරුෂ අනුව | | | | | | | | |
| පුරුෂ | 6.0 | 5.5 | 5.3 | 5.5 | 4.9 | 4.6 | 4.3 | 4.7 |
| ස්ත්‍රී | 12.8 | 11.9 | 10.7 | 10.1 | 8.7 | 9.8 | 9.8 | 9.7 |
| වයස් කාණ්ඩ අනුව (අවුරුදු) | | | | | | | | |
| 15-19 | 28.3 | 30.8 | 33.2 | 31.3 | 23.3 | 20.7 | 20.3 | 23.1 |
| 20-29 | 19.2 | 17.2 | 16.0 | 16.8 | 15.3 | 16.4 | 15.9 | 15.9 |
| 30-39 | 4.0 | 3.8 | 3.5 | 3.5 | 2.9 | 3.2 | 3.3 | 3.3 |
| 40 සහ ඊට ඉහළ | 1.3 | 1.2 | 2.4 | 1.3 | 1.1 | 1.2 | 1.5 | 1.4 |
| අධ්‍යාපන මට්ටම අනුව | | | | | | | | |
| 4 ශ්‍රේණිය/5 වසර සහ ඊට පහළ | 2.0 | 1.8 | - | - | - | - | - | - |
| 5-9 ශ්‍රේණිය/6-10 වසර | 6.9 | 6.3 | 6.1 | 6.5 | 5.9 | 5.6 | 5.5 | 5.8 |
| අ.පො.ස. (සා.පෙ)/ජා.පො.අ.ස | 12.3 | 11.5 | 10.6 | 10.0 | 10.3 | 9.9 | 9.2 | 9.9 |
| අ.පො.ස. (උ.පෙ)/උ.ජා.අ.ස සහ ඊට ඉහළ | 16.8 | 13.8 | 12.2 | 12.1 | 10.6 | 11.3 | 12.0 | 11.6 |

(අ) 2004 වාර්ෂික ඇස්තමේන්තු සඳහා මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික්ක ඇතුළත් කර නොමැත.
(ආ) 2005 වර්ෂයේ කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය එක් වරක් පමණක් අගෝස්තු මාසයේදී පවත්වන ලදී.
(ඇ) උතුරු හා නැගෙනහිර පළාත් දෙකෙහි දත්ත ඇතුළත් කර නොමැත.

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

වසර අවසානය වනවිට විදේශ රටවල සේවය කරයි. කෙසේ වෙතත්, 2006 වසර තුළ වූ විදේශ සේවා නියුක්තිය 201,143 වූ අතර, එය 2005 දී වූ 231,290 හා සසඳන විට සියයට 13 කින් අඩු වීමක් පෙන්වීය. මෙම අඩුවීමට ප්‍රධාන ලෙස මැද පෙරදිග කලාපයේ පැවැති දැඩි අවිනිශ්චිත වාතාවරණය සහ පුහුණු ශ්‍රමිකයන්ගේ සහ ගෘහ සේවිකාවන්ගේ සැපයුම අඩුවීමත් හේතුවිය. විදේශ සේවා නියුක්තියෙන් සියයට 90 කට වඩා ප්‍රමාණයකට දායක වන්නේ මැද පෙරදිග කලාපයයි. කෙසේ වෙතත්, රජය මේ සඳහා මැදිහත්වීමෙන් පසුව සැලකිය යුතු මට්ටමක රැකියා අවස්ථාවන් ප්‍රමාණයක් මෑත කාලීනව දකුණු කොරියාවෙන් හා මැලේසියාවෙන් ඇති විය.

**පුරුෂ පක්ෂයේ විදේශ සේවා නියුක්ති අවස්ථාවන්හි දායකත්වය පෙර පරිදිම වැඩිවීමක් දක්නට ලැබුණි.** පුරුෂ පක්ෂයේ දායකත්වය 1990 මැද භාගයේ දී සියයට 25 ක් වූ අතර 2004 දී එය සියයට 41 දක්වාත්, 2006 දී එය සියයට 44 දක්වාත් ඉහළ ගියේය. මෙම ඉහළ යාම, පසුගිය වසර දෙක තුළ කටාර් රාජ්‍යයෙන් පුහුණු හා නුපුහුණු රැකියාවන් සඳහා පුරුෂ පක්ෂයට තිබූ ඉල්ලුම ඉහළ යාම නිසා සිදු විය. මේ නිසා විදේශ සේවා

**4.13 සංඛ්‍යා සටහන**

**විදේශ සේවා නියුක්තිය**

| විදේශ සේවා නියුක්තිය | 2004 සංඛ්‍යාව | 2004 ප්‍රතිශතය | 2005 සංඛ්‍යාව | 2005 ප්‍රතිශතය | 2006(අ) සංඛ්‍යාව | 2006(අ) ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| මුළු විදේශ රැකියා සංඛ්‍යාව | 214,709 | 100 | 231,290 | 100 | 201,143 | 100 |
| මූලයන් අනුව (%) | | | | | | |
| ලියාපදිංචි නියෝජිතයින් | 156,146 | 73 | 165,707 | 72 | 142.883 | 71 |
| වෙනත් | 58,563 | 27 | 65,583 | 28 | 58,260 | 29 |
| ස්ත්‍රී/පුරුෂ අනුව (%) | | | | | | |
| පුරුෂ | 80,699 | 38 | 93,896 | 41 | 88,747 | 44 |
| ස්ත්‍රී | 134,010 | 62 | 137,394 | 59 | 112,396 | 56 |
| ශ්‍රම කාණ්ඩ අනුව (%) | | | | | | |
| ගෘහ සේවිකා | 110,512 | 51 | 125,493 | 54 | 100,326 | 50 |
| වෙනත් | | | | | | |
| පුහුණු ශ්‍රමිකයන් | 45,946 | 21 | 46,688 | 20 | 44,464 | 22 |
| නුපුහුණු ශ්‍රමිකයන් | 43,204 | 20 | 41,904 | 18 | 40,518 | 20 |
| වෙනත් | 15,047 | 7 | 17,205 | 8 | 15,835 | 8 |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය

**4.14 සංඛ්‍යා සටහන — ගමනාන්තය අනුව විදේශ සේවා සංක්‍රමණ**

| රට | 2005 | | 2006(අ) | | වෙනස(අ) | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | දායකත්වය (%) | සංඛ්‍යාව | දායකත්වය (%) | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| කටාර් | 35,953 | 15.5 | 31,177 | 15.5 | -4776.0 | -13.3 |
| සෞදි අරාබියාව | 76,210 | 33.0 | 61,385 | 30.5 | -14825.0 | -19.5 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 36,371 | 15.7 | 33,386 | 16.6 | -2985.0 | -8.2 |
| කුවේට් | 36,157 | 15.6 | 34,526 | 17.2 | -1631.0 | -4.5 |
| වෙනත් | 46,599 | 20.2 | 40,669 | 20.2 | -5930.0 | -12.7 |
| එකතුව | 231,290 | 100.0 | 201,143 | 100.0 | -30147.0 | -13.0 |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය

නියුක්තිය සඳහා කාන්තා දායකත්වය 2005 දී සියයට 59 සිට 2006 දී සියයට 56 දක්වා තවදුරටත් අඩු විය.

**රජය විසින් සංක්‍රමනික ශ්‍රමිකයින්ගේ කුසලතා සංවර්ධනය සඳහා අනුබල දීමක් සිදුකළ ද සංක්‍රමික ශ්‍රමිකයින්ගෙන් සියයට 70 ක් පමණ නුපුහුණු ශ්‍රමිකයින් වූ අතර වඩාත් අවදානමට ලක්වන හා පහළ ආදායම් උපයන කාණ්ඩය වන ගෘහ සේවිකාවන්ගේ දායකත්වය 2005 වසරේදී සියයට 54 සිට 2006 වසරේදී සියයට 50 දක්වා අඩුවීමක් සිදුවිය.** මිනිස් බල කාණ්ඩවලින් වැඩි යොමුකිරීමක් ඇති ගෘහ සේවිකාවන් සඳහා විශේෂයෙන් මැද පෙරදිග රටවල එනම් සෞදි අරාබිය, කුවේට්, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, කටාර්, ලෙබනන් හා ජෝර්දානය යන රටවල මේ සඳහා ඒකාබද්ධ දායකත්වය සියයට 80කට වඩා වැඩිවේ. නමුත් මැලේසියාව සහ දකුණු කොරියාව වැනි රටවලට පුහුණු ශ්‍රමිකයින් සංක්‍රමණය වීම සඳහා වැඩි අවධානයක් යොමු කරන බව පැහැදිලිව පෙනී යයි. මේ නිසා රජයේ නව ප්‍රතිපත්තියක් ලෙස එම රටවලට පුහුණු ශ්‍රමිකයින්ගේ සංක්‍රමණය සඳහා රුකුල් දීමක් සිදු කරනු ලබයි.

## ශ්‍රම ඵලදායිතාවය

**2006 වසරේ දී ශ්‍රම ඵලදායිතාවය පසුගිය වසර කිහිපය තුළ දී තිබූ ඉහළ යෑමේ නැඹුරුතාවය පෙන්නුම් කරමින් තවදුරටත් ඉහළ ගියේය.** එකතු කළ අගය මත පදනම්ව පසුගිය වසර හා සැසඳීමේ දී සියයට 3 ක පමණ ඉහළ යාමක් පෙන්නුම් කළ අතර, වසර දෙක අතර සැසඳීම සඳහා සේවා නියුක්ති අගයන් උතුරු හා නැගෙනහිර පළාත් සඳහා ගැලපීමෙන් එක් පුද්ගලයකු සඳහා මෙම අගය රුපියල් 142,700 ක් විය. 2006 වසරේ ඵලදායිතාවය සඳහා ප්‍රධාන ලෙස උපකාරී වූයේ සේවා අංශය අතරේ සැලකිය යුතු ඵලදායිතා වර්ධනයක් සිදුවීම වන අතර කර්මාන්ත අංශයේ ආන්තික වර්ධනයක් දැක්විය. මේ අතර කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාවය පහළ මට්ටමක තවදුරටත් පැවතීම වසර තුළ සමස්ත ඵලදායිතා වර්ධනය වසර 2005 හා සසඳන විට අඩුවීම සඳහා හේතුවක් විය.

## කම්කරු සබඳතා

**පසුගිය දශකය පුරා ම පැවැති අවම තත්ත්වය පෙන්නුම් කරමින් 2006 වසර තුළ දී පුද්ගලික අංශයේ වැඩ වර්ජන සංඛ්‍යාවේ අඩුවීමක් විය.** කෙසේ වෙතත්, ඊට ප්‍රතිවිරුද්ධ ලෙස වැඩ වර්ජන නිසා අහිමි වූ මුළු මිනිස් දින ගණන හා සහභාගි වූ සේවකයන් සංඛ්‍යාව වසර 2006 තුළ දී ඉහළ ම අගය වාර්තා කළ අතර, මෙයට වැවිලි අංශයේ විශාල සේවක සංඛ්‍යාවක් සහභාගි වී 2006 වසරේ සිදු කරන ලද කම්කරු ක්‍රියාමාර්ගය හේතු විය. 2006 වසරේ හතරවන කාර්තුවේ දී වැවිලි අංශයේ සිදු වූ යම් වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයන් වැවිලි කර්මාන්තයට දැඩි බලපෑමක් ඇති කළේය. වැවිලි අංශයේ අහිමි වූ මිනිස් දින ගණන මගින් අඟවනුයේ වැවිලි අංශයට මෙන්ම අපනයන වෙළෙඳ අංශයට ද නිෂ්පාදනයන් හා ඒවායේ තත්ත්වයන් නැවත සාමාන්‍ය තත්ත්වයට පත්වන තුරු එහි බලපෑම දරන්නට සිදුවන බවය. පෞද්ගලික අංශයේ වැවිලි අංශය හැර සෙසු අංශයන්හි වර්ජන සංඛ්‍යාව 2006 වසරේ දී අඩුවීමක් සිදු විය. මෙම කාණ්ඩයේ අහිමි වූ මුළු මිනිස් දින ගණන හා සහභාගි වූ සේවක සංඛ්‍යාවල සියයට 50 කට වඩා වැඩි දෘශ්‍යමාන අඩුවීමක් පෙන්නුම් කළේය. වෘත්තීය සමිති හා සේව්‍ය පාර්ශ්වයන් අතර ඇතිකර ගන්නා ලද සාමූහික ගිවිසුම් ඔවුන් අතර ඇතිකර ගන්නා යහපත් සම්බන්ධතාවයන් හා රැකියා ස්ථානවල කාර්මික සහයෝගිත්වය වැඩිදියුණු කර ගැනීම සඳහා පවත්වාගෙන ගිය ඉහළ මට්ටමේ සමාජ කතිකාවන් වැනි විවිධ හේතූන් නිසා මෙවැනි සතුටුදායක වර්ධනයක් සිදු විය. දිවයින තුළ ආයෝජනවල හා ඵලදායිතාවයේ වර්ධනයක් සඳහා මෙවැනි හිතකර පාරිසරික තත්ත්වයන් දිගින් දිගට ම පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වේ.

**රාජ්‍ය අංශයේ මූලික ආයතන කිහිපයක ඇති වූ ආරාවුල් කිහිපයක් මගින් සමස්ත කම්කරු සහයෝගිත්වය දිගට ම පවත්වාගෙන යාමේ ජාතික අවශ්‍යතාවය පෙන්වා දුනි.** මේ ආකාරයට සමහර මූලික රාජ්‍ය ආයතන එනම් ශ්‍රී ලංකා දුම්රිය, ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා වරාය

**4.15 සංඛ්‍යා සටහන — ප්‍රධාන ආර්ථික අංශ අනුව ශ්‍රම ඵලදයීතාව**

| ශීර්ෂය | 2004 | 2005 (අ) | 2006(ආ) |
|---|---|---|---|
| ස්ථාවර (1996) මිල අනුව | | | |
| ද.දේ.නි. (රු. මිලියන) | 980,720 | 1,039,763 | 1,116,215 |
| කෘෂිකාර්මික | 175,852 | 179,278 | 187,729 |
| කර්මාන්ත | 259,286 | 280,868 | 300,982 |
| සේවා | 545,582 | 579,618 | 627,504 |
| ශ්‍රම ඵලදායීතාව එක් පුද්ගලයකු සඳහා රු. '000(ඇ) | 134.0 | 138.3 | 142.7 |
| කෘෂිකාර්මික | 70.8 | 77.7 | 73.8 |
| කර්මාන්ත | 161.3 | 153.3 | 154.8 |
| සේවා | 169.1 | 172.1 | 188.5 |

(අ) තාවකාලික
(ආ) පුරෝකතනය කරන ලදී.
(ඇ) උතුරු හා නැගෙනහිර පළාත් ඇතුළත් නොවූ නිසා ගලපන ලද සේවා නියුක්ති අගයන් භාවිතා කරන ලදී.

මූලයන් : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**4.16 සංඛ්‍යා සටහන**

**පෞද්ගලික අංශයේ කර්මාන්තවල වැඩ වර්ජන**

| වර්ෂය | වතු අංශය | | | වෙනත් අංශ(අ) | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන |
| 2004 | 44 | 15,832 | 40,779 | 46 | 17,514 | 40,321 | 90 | 33,346 | 81,000 |
| 2005 | 17 | 4,283 | 8,370 | 40 | 49,282 | 149,982 | 57 | 53,565 | 158,352 |
| 2006 (ආ) | 19 | 196,520 | 4,821,394 | 34 | 13,283 | 72,513 | 53 | 209,803 | 4,893,907 |
| පළමු කාර්තුව | 8 | 1,973 | 4,360 | 9 | 3,726 | 46,368 | 17 | 5,699 | 50,728 |
| දෙවන කාර්තුව | 3 | 1,463 | 2,593 | 7 | 4,166 | 10,932 | 10 | 5,629 | 13,525 |
| තෙවන කාර්තුව | 6 | 1,805 | 7,645 | 8 | 1,719 | 7,949 | 14 | 3,524 | 15,594 |
| සිව්වන කාර්තුව | 2 | 191,279 | 4,860,796 | 10 | 3,672 | 7,264 | 12 | 194,951 | 4,814,060 |

(අ) අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික ආයතන ඇතුළත්ය
(ආ) තාවකාලික

මූලය : කම්කරු දෙපාර්තමේන්තුව

අධිකාරිය හා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව වැනි ආයතන කිහිපයක සේවකයන් තුළ නොසන්සුන්තාවයක් පසුගිය වසර තුළ පැවැතීම කළමනාකාරීත්වය හා වෘත්තීය සමිති අතර කාර්මික සම්බන්ධතාවය වැඩිදියුණු කිරීමට උපකාරී වන පසුබිමක් ඇතිකිරීමේ අවශ්‍යතාවය පෙන්නුම් කළේය.

### ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණය

**කම්කරු සබඳතා හා විදේශ රැකියා නියුක්ති අමාත්‍යාංශය විසින් වසර 2006 දී කාන්තා, තරුණ හා ළමා (සංශෝධන) පනත පාර්ලිමේන්තුවේ දී සංශෝධන සහිතව සම්මත කර ගැනීම නිසා වයස අවුරුදු 18 ට අඩු අයට උපද්‍රව සහිත රැකියාවල නියුක්ත කරවීම තහනම් කරනු ලැබීය.** මීට පෙර වර්ගීකරණය කරන ලද උපද්‍රව සහිත කාර්යයන්වලට සමාන රැකියාවල දරුණු ලෙස ළමා ශ්‍රමය යෙදවීම ආවරණය කරන වයස අවුරුදු 18 ට අඩු අය සඳහා වූ නියෝගයන් නොතිබිණි. මේ පිළිබඳව මෙහෙයුම් කාරක සභාව විසින් ළමා ශ්‍රමය යෙදවීමේදී දරුණු ලෙස වර්ගීකරණය කළ හැකි සේවා නියුක්ති කාණ්ඩවලින් ළමා ශ්‍රමය ඉවත් කිරීම පරීක්ෂා කිරීමට සුදුසු නියෝජිත මණ්ඩලයක් නම් කරනු ලැබීය.

**කම්කරු සබඳතා හා විදේශ රැකියා නියුක්ති අමාත්‍යාංශය විසින් 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත හා 1971 අංක 45 දරන සේවකයින්ගේ සේවය අහෝසි කිරීමේ පනත සංශෝධනය කරමින් සේවය අහිමිවීමෙන් පසු කම්කරු කොමසාරිස්වරයාට ඉදිරිපත් කළ හැකි අභියාචනය සඳහා සේවය අහෝසි කිරීමේ පනත හා කම්කරු ආරවුල් පනත අනුව තිබූ කාලය මාස 3 සිට මාස 6 දක්වා දීර්ඝ කරනු ලැබීය.** තවද, 1975 අංක 6 දරන සේවක අර්ථසාධක අරමුදල (විශේෂ විධිවිධාන) පනත සඳහා ද සංශෝධන කිහිපයක් යෝජනා කර ඇත. 1990.02.01 වනවිට පැවැති තහවුරු කළ හැකි, අනුමත කරන ලද අර්ථසාධක අරමුදල් හා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම හා දැනට පවත්නා සේවක අර්ථ සාධක අරමුදලට වඩා වාසි සහගත වන බවට කම්කරු කොමසාරිස්වරයාට නිගමනය කළ හැකි විශ්‍රාම වැටුප් අරමුදල් සඳහා කම්කරු කොමසාරිස්වරයාට බලය ලබා දීමට අවශ්‍ය නීති සංශෝධනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී. මේ ආකාරයට මෙම යෝජනාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු අතර අදාල සංශෝධන සිදුකර කෙටුම්පත් කිරීමට නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් ලබා දී ඇත. තවද, කම්කරු සබඳතා හා විදේශ රැකියා නියුක්ති අමාත්‍යාංශය විසින් 1942 අංක 45 දරන කර්මාන්ත ශාලා නියෝග පනත මගින් සියලුම අංශවල සේවකයන් ආවරණය නොවන නිසා එය අවලංගු කර දැමීම පිළිබඳව ද සලකා බලාගෙනයයි. මේ සඳහා සියලුම අංශවල සෑම සේවකයෙක් ම ආවරණය වන පරිදි සකස් කරන ලද සේවයේ දී රැකියාවේ ආරක්ෂාව, සෞඛ්‍යය හා සුභසාධනය නමින් නව පනතක් යෝජනා කර ඇත.

**කම්කරු සබඳතා හා විදේශ රැකියා නියුක්ති අමාත්‍යාංශය විසින් යහපත් සේවයක් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සඳහා අදාල වන වැඩකටයුතු ආරම්භ කර ඇත.** මේ සඳහා අමාත්‍යතුමාගේ සභාපතිත්වයෙන් යුත් ත්‍රෛපාර්ශ්වික මෙහෙයුම් කාරක සභාවක් පත්කර ඇති අතර එමගින් යෝජිත ජාතික ප්‍රතිපත්තිය හා ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ කෙටුම්පත් සකස් කිරීම සිදුකරනු ලබයි. ශ්‍රී ලංකාවේ යහපත් සේවයක් සඳහා ජාතික ප්‍රතිපත්තිය මගින් යහපත් සේවයක් සඳහා අවධානය යොමුකළ යුතු අංශවල පවතින දුර්වලතා හඳුනාගනු ලබන අතර ඒවා මැඩලීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සැකැස්ම නිර්මාණය කරනු ලබයි. මෙම ජාතික ප්‍රතිපත්තිය ත්‍රෛපාර්ශ්විකව නිර්මාණය වන අතර ප්‍රාදේශීය සහභාගිත්වය තුළින් එය ක්‍රියාවට නැංවීම සිදු කරනු ලබයි. මෙම යහපත් සේවයක් සඳහා ජාතික ප්‍රතිපත්තිය යටතේ රැකියා අවස්ථා, රැකියා අයිතිය, සමාජ ආරක්ෂණය, සමාජ සංවාදය හා ලබාගත හැකි තත්ත්වයේ රැකියා නිර්මාණය කිරීම යන ප්‍රධාන අංශ කෙරෙහි අවධානය යොමු කරනු ලබයි. ඒ අනුව දැනට පවතින ප්‍රතිපත්ති සමග යහපත් සේවයක්

**විශේෂ සටහන 5**

## උද්ධමනය මැනීම සඳහා වඩාත් නියෝජනාත්මක මිනුමක අවශ්‍යතාවය

සමස්ත මිල මට්ටමෙහි අඛණ්ඩව සිදුවන වෙනස උද්ධමනය ලෙස හැඳින්වේ. උද්ධමනය මැනීමේ ක්‍රියාවලියේදී සිදුවන්නේ කේවල භාණ්ඩ හා සේවාවල මිල මට්ටම්හි ඇතිවන වෙනස්වීම් ඒකාබද්ධ කිරීමෙන් සාමාන්‍ය මිල මට්ටමෙහි වෙනස ගණනය කිරීමයි. මුදල් ප්‍රතිපත්තියෙහි අරමුණ වන මිල ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා නිවැරදි උද්ධමන මිනුමක පැවැත්ම ඉතා වැදගත්ය.

ආර්ථිකයක හුවමාරු වන සියලු භාණ්ඩ හා සේවා වල මිල වෙනස්වීම් නිරීක්ෂණය කිරීම යථාරූපී නොවේ. මේ නිසා, උද්ධමන මිනුම්, ආර්ථිකයක හුවමාරු වන, පරිභෝජනය කෙරෙන හෝ නිෂ්පාදනය කෙරෙන භාණ්ඩ හා සේවා වලින් තෝරාගත් කොටසක්, එනම් "භාණ්ඩ පැසක්" මත පදනම් වේ. ශ්‍රී ලංකාවේ භාවිතා වන මිල දර්ශක, පැසට අයත් වන භාණ්ඩ හා සේවා, එම භාණ්ඩ හා සේවාවලට ලබා දී ඇති බර තැබීම්, මිල ගණන් එකතු කරනු ලබන භූගෝලීය ප්‍රදේශය, ජන ආවරණය සහ පාදක වර්ෂය අනුව එකිනෙකින් වෙනස් වේ. ශ්‍රී ලංකාවේ නිල ජීවන වියදම් දර්ශකය ලෙස සලකනු ලබන්නේ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.)යි. ශ්‍රී ලංකාවේ දැනට භාවිතා කෙරෙන අනෙකුත් මිල දර්ශක වන්නේ ශ්‍රී ලංකා පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (ශ්‍රී.ල.පා.මි.ද.), මහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (ම.කො.පා.මි.ද.), කොළඹ දිස්ත්‍රික් පාරිභෝගික මිල දර්ශකය (කො.දි.පා.මි.ද.), තොග මිල දර්ශකය (තො.මි.ද.) බස්නාහිර පළාත් පාරිභෝගික මිල දර්ශකය (බ.ප.පා.මි.ද.) සහ ප්‍රාදේශීය මිල දර්ශක කිහිපයක්ය.

පැරණිතම දර්ශකය වන කො.පා.මි.ද. 1949/50 වර්ෂවල කොළඹ නගරසභා සීමාව තුළ තුළ වාසය කළ, අඩුම වියදම් රටාවක් ඇති කුටුම්භ සියයට 40 මත පදනම්ව සකස් කරන ලද්දකි. මෙම දර්ශකය සම්පාදනය කොට ප්‍රකාශයට පත්කරනු ලබන්නේ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන් වන අතර, 1944 පඩි පාලක සභා ආඥා පනතෙහි ප්‍රතිපාදනවලට අනුකූලව ජීවන වියදමෙහි ඇතිවන වෙනස් වීම් පිළිබඳව නිල දර්ශකය ලෙස සැලකේ. මේ අනුව, එම නීතියෙන් ආවරණය වන රාජ්‍ය සේවකයින්, වතු කම්කරුවන් සහ අනෙකුත් කර්මාන්තවල නියැලෙන සේවකයින්ගේ ජීවන වියදම් දීමනා තීරණය කිරීමට මෙය යොදාගනු ලබයි.

සමස්ත මිල වෙනස්වීම් නිරූපනය වන පරිදි භාණ්ඩ පැසට ඇතුළත් වන භාණ්ඩ හා සේවා තෝරාගැනීම ඉතා වැදගත් වේ. ඒ හා සමානවම, තෝරාගත් එක් එක් අයිතම සඳහා නිවැරදි බර තැබීම් ලබාදීමද මිල දර්ශකයක් සකස් කිරීමේදී වැදගත් වේ. මෙය සහතික කිරීමට නම් ඉලක්ක ජනගහනයෙහි පරිභෝජන රටා සම්බන්ධව සමකාලීනව කරන ලද සමීක්ෂණයක් මත පදනම්ව ජීවන මිල දර්ශකයට තෝරාගනු ලබන අයිතම සහ ඒවාට ලබා දෙන බර තැබීම් තීරණය කළ යුතුය. මෙම පදනම මත ශ්‍රී ලංකාවේ නිල උද්ධමන මාපකය නිසැකයෙන්ම යල්පැන ගොස් ඇත. මෑතකදී කරන ලද සමීක්ෂණ දෙකක් වන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වන ලද 2003/2004 පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණය සහ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් 2005 දී පවත්වන ලද 2005 කුටුම්භ ආදායම් හා වියදම් සමීක්ෂණයෙහි ප්‍රතිඵල හා සසඳන විට කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි බර තැබීම් සැලකිය යුතු ලෙස වෙනස් බව පෙනී යයි. වි.ස. 5.1 සංඛ්‍යා සටහනෙහි විවිධ වියදම් කාණ්ඩ සඳහා උක්ත සමීක්ෂණ වල හා කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි බර තැබීම් සංසන්දනය කොට ඇත.

1952 සිට වියදම් රටාවෙහි සිදුවූ වෙනස්කම් පිළිබිඹු කරමින් කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි භාණ්ඩ පැසට ගෑස්, ජල ගාස්තු, දුරකථන ගාස්තු, පෞද්ගලික ඉගැන්වීම් ගාස්තු

සංඛ්‍යා සටහන වි.ස. 5.1

**කුටුම්භ වල වියදම් ව්‍යුහය**

| වියදම් | කො.පා.මි.ද.හි වියදමෙහි ප්‍රතිශතය | පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණය 2003/04 | කුටුම්භ ආදායම් හා වියදම් සමීක්ෂණය 2005 |
|---|---|---|---|
| ආහාර හා පාන වර්ග | 72% | 35% | 40% |
| මත්පැන් හා මත්ද්‍රව්‍ය | 6% | 2% | 2% |
| ඇඟලුම් | 2% | 7% | 3% |
| නිවාස, ජලය, ඉන්ධන සහ විදුලිය | 10% | 15% | 15% |
| අධ්‍යාපනය හා සෞඛ්‍යය | 1% | 6% | 8% |
| ප්‍රවාහන හා සන්නිවේදන | 2% | 12% | 9% |
| විනෝදාත්මක හා සංස්කෘතික | 2% | 7% | 2% |
| විවිධ | 5% | 16% | 21% |
| එකතුව | 100% | 100% | 100% |

සහ මදුරු දඟර වැනි වර්තමානයේ ප්‍රධාන වියදම් ශීර්ෂ අඩංගු නොවේ. එම භාණ්ඩ පැසෙහි ආහාර සඳහා අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි නියෝජනය වීමක් ඇත. තවද එහි භූගෝලීය ආවරණය කොළඹ නගර සභා ප්‍රදේශයට සීමා වීමද දක්නට හැකිය. ශ්‍රී ලංකා පාරිභෝගික මිල දර්ශකයද වඩාත් පුළුල් භූගෝලීය ප්‍රදේශයක් ආවරණය කළද, මෙයද ආහාර ද්‍රව්‍ය වැඩි වශයෙන් නියෝජනය කිරීම වැනි දුර්වලතා ප්‍රමාණවත් ලෙස ආවරණය කර නොමැති බැවින්, සුදුසු විකල්ප මිල දර්ශකයක් ලෙස සැලකිය නොහැකිය.

කොළඹ පාරිභෝගික මිල දර්ශකය යොදා ගනිමින් උද්ධමනය ගණනය කිරීමේ ක්‍රමවේදය තුළ කාලාන්තරයක් පුරා ස්ථාවර පරිභෝජන රටාවක් පවතින බව මෙන්ම භාණ්ඩ හා සේවාවල ගුණාත්මක භාවය නොවෙනස්ව පැවැතී ඇති බවට උපකල්පනය කෙරේ. එහෙත් මෙය විශේෂයෙන්ම දිගුකාලීනව යථාර්ථවාදී උපකල්පනයක් නොවේ. තාක්ෂණික දියුණුව හේතුවෙන් පරිභෝජන භාණ්ඩවල ගුණාත්මක භාවය කාලයත් සමඟ වෙනස් වේ. මේ හා සමගම, පරිභෝජන පැසට නව භාණ්ඩ එකතු වන අතර, පැරණි භාණ්ඩ ඉවත් වේ. තවද, කාලයත් සමඟ කුටුම්භ ආදායම් මට්ටම් වෙනස්වීම හේතුවෙන් පරිභෝජන ප්‍රමාණයන්ද වෙනස් වේ.

මෙවැනි වෙනස්වීම් පිළිබඳ ගැටලුවලට විසඳුමක් ලෙස සෙසු රටවල් විසින් සිදුකරනුයේ සමකාලීන සමීක්ෂණයන්හි ප්‍රතිඵල අනුව, අන්තර්ගත අයිතම හා ඒවායේ බරතැබීම් වෙනස් කිරීමෙන්, අදාළ දර්ශක නිසි ලෙස සංශෝධනය කිරීමයි. පාරිභෝගික මිල දර්ශක සකස් කරනු ලබන සංඛ්‍යා ලේඛන ආයතන විසින් දර්ශකයේ ඇති එක් එක් අයිතමයට අදාළ පාදක බර තැබීම් නැවත සංශෝධනය කිරීම කාල සටහනක් අනුව සිදු කරයි. එක්සත් ජනපදයේ පාරිභෝගික මිල දර්ශකයේ බර තැබීම් වසර දෙකකට වරක් සංශෝධනය කෙරෙන අතර, එක්සත් රාජධානියේ පාරිභෝගික මිල දර්ශකයේ හා සිල්ලර මිල දර්ශකයේ බර තැබීම් වාර්ෂිකව සංශෝධනය කෙරේ. අනෙකුත් බොහොමයක් රටවල් විසින්ද පාරිභෝගික මිල දර්ශකයේ බර තැබීම් අවම වශයෙන් වසර පහකට වරක් සංශෝධනය කරනු ලබයි. ලංකාවේ නිල දර්ශකයට අදාළව සංශෝධන කාල සටහනක් ප්‍රකාශයට පත් නොකළද, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් කලින් කලට බර තැබීම් වෙනස් කර ඇති අතර, අවසන් සංශෝධනය සිදු කර ඇත්තේ 1995 දීය. වි.ස. 5.2 සංඛ්‍යා සටහනෙහි විවිධ රටවල පාරිභෝගික මිල දර්ශක වලට අදාළ සංශෝධන කාල සටහන් දක්වා ඇත.

පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණවලින් පෙනී යන පරිදි ශ්‍රී ලංකාවේ නිල උද්ධමන මාපකය මගින් රටේ සැබෑ ජීවන වියදම නියෝජන නොවීමේ ඉඩකඩ වැඩිවෙමින් පවතින බැවින් ශ්‍රී ලංකාවද ජාත්‍යන්තර මනා පරිචයන් අනුග මනය කරමින් සුදුසු සංශෝධන ක්‍රියාත්මක කළ යුතු වේ. මේ අතරම, වර්තමානයේ පවතින අනෙකුත් මිල දර්ශකද නිල මිල දර්ශකටය විකල්පයක් ලෙස යොදා ගැනීමට සුදුසු මට්ටමක නොපවතී. මේ නිසා සමකාලීන පාරිභෝගික සමීක්ෂණ මත පදනම් වූ නව මිල දර්ශකයක් ගණනය කොට, එය නිල උද්ධමන මාපකය ලෙස ස්ථාපිත කිරීමට සුදුසු කාලය දැන් එළැඹී ඇත.

මූලාශ්‍ර :

Consumer Price Index Manual : Theory and Practice (2004), the International Labour Office, Geneva,August 2004.

Department of Census and Statistics, Sri Lanka (2006), "Household Income and Expenditure Survey 2005 - Summary Findings," ISSN 1391 - 4693, October 2006.

සංඛ්‍යා සටහන වි.ස. 5.2

**විවිධ රටවල් වල නිල පාරිභෝගික මිල දර්ශක සැසඳීම**

| රට | මිල දර්ශකය | වගකිවයුතු ආයතනය | ආවරණය | සංශෝධන කාලසටහන |
|---|---|---|---|---|
| ඇමරිකා එක්සත් ජනපදය | පාරිභෝගික මිල දර්ශකය | කම්කරු සංඛ්‍යා ලේඛන කාර්යාංශය | මාසිකව වෙළෙඳසැල් 2,300 කින් පමණ මිල ගණන් 80,000ක් ලබාගනී. | අතීතයේදී බර තැබීම් සංශෝ - ධනයන් දශකයකට වරක් සිදු කෙරී ඇත. 2002 වසර සිට මෙය දෙවසරකට වරක් සිදුකරන අතර, වෙළෙඳපොළ භාණ්ඩ පැස අවසන් වරට 2002 දී සංශෝ - ධනය කර ඇත. |
| එක්සත් රාජධානිය | සිල්ලර මිල දර්ශකය | මධ්‍යම සංඛ්‍යා ලේඛන කාර්යාලය | රට පුරා විසිරී ඇති ප්‍රදේශ 150 ක වෙළෙඳසැල් 20,00ක පමණ මිල හැසිරීම් මනිනු ලබයි. | භාණ්ඩ හා සේවා පැස මෙන්ම එකී අයිතම වල බර තැබීම් වසරක් පාසා සංශෝධනය කරනු ලබයි. |
| ප්‍රංශය | පාරිභෝගික මිල දර්ශකය | ජාතික සංඛ්‍යාන හා ආර්ථික අධ්‍යයන ආයතනය | ප්‍රංශ ප්‍රධාන භූමි ප්‍රදේශයේ සියලු නගර හා 2000 ඉක්මවා ජනගහනයක් ඇති තම එතෙර භෞමික ප්‍රදේශත් ආවරණය කරයි. | දෙවසරකට පෙර ජාතික නිෂ්පාදිතයේ අවසන් පාරිභෝගික රටා පිළිබඳ දත්ත වලට අනුකූලව බර තැබීම් ප්‍රතිගණනය කෙරේ. |

| රට | මිල දර්ශකය | වගකිවයුතු ආයතනය | ආවරණය | සංශෝධන කාලසටහන |
|---|---|---|---|---|
| කැනඩාව | පාරිභෝගික මිල දර්ශකය | ස්ටැටිස්ටික්ස් කැනඩා | මෙම දර්ශකය කැනඩාවේ සියලු ප්‍රාන්තත් අනෙකුත් භෞමික ප්‍රදේශත් ආවරණය කරයි. | සාමාන්‍යයෙන් බර තැබීම් වසර 4 කට වරක් සංශෝධනය කෙරෙන අතර, දර්ශකයේ පාදක වර්ෂය දශකයකට වරක් සංශෝධනය කෙරේ. |
| ජර්මනිය | පාරිභෝගික මිල දර්ශකය | ෆෙඩරල් හා ප්‍රාදේශීය සංඛ්‍යාන කාර්යාල | රටපුරා විසිරී ඇති නගරසභා 190 ක ඇති වෙළෙඳසැල් 40,000 කින් පමණ මිල ගණන් රැස්කරනු ලබයි. | දර්ශකයේ භාවිතා වන බරතැබීම් වසර පහකට වරක් සංශෝධනය කෙරේ. |
| ජපානය | පාරිභෝගික මිල දර්ශකය | ජපාන සංඛ්‍යාන කාර්යාංශය | සියලු දිස්ත්‍රික්ක හා ප්‍රධාන නගර ආවරණය වේ. | දර්ශකය වසර 5 කට වරක් සංශෝධනය කරන අතර, වර්තමාන පාදක වසර 2005 වේ. ඇතුළත් වන භාණ්ඩ හා ඒවායේ බරතැබීම්ද මෙම සංශෝධන වලදී නැවත සලකා බැලේ. |
| කොරියාව | පාරිභෝගික මිල දර්ශකය | ජාතික සංඛ්‍යාන කාර්යාංශය | සමස්ත නාගරික ජනගහනයෙන් සියයට 82 ක් අන්තර්ගත වන සේ නගර 36 ක් ආවරණය කරයි. | දර්ශකයේ බරතැබීම් හා පාදක වර්ෂය වසර 5 කට වරක් සංශෝධනය කෙරේ. |
| සිංගප්පූරුව | පාරිභෝගික මිල දර්ශකය | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව | වෙළෙඳසැල් 2,410 කින් මිල ගණන් 33,400 ක් රැස්කරයි. | බරතැබීම් වසර 5 කට වරක් යාවත්කාලීන කරයි. |
| ඕස්ට්‍රේලියාව | පාරිභෝගික මිල දර්ශකය | ඕස්ට්‍රේලියානු සංඛ්‍යාන කාර්යාංශය | සියලු ප්‍රධාන නගර ආවරණය කරයි. | ප්‍රධාන සංශෝධන වසර 5 කට වරක් සිදු කෙරේ. |
| මැලේසියාව | පාරිභෝගික මිල දර්ශකය | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව | මාසිකව රට පුරා සිල්ලර වෙළෙඳසැල් 19,00 කින් පමණ මිල ගණන් 190,000ක් පමණ රැස් කරයි. | බරතැබීම් වසර 5 කට වරක් සිදුකරන අතර, මෙයට සමගාමීව පාදක වර්ෂයද වෙනස් කෙරේ. |
| චීනය | පාරිභෝගික මිල දර්ශකය | රාජ්‍ය සංඛ්‍යාන කාර්යාංශය | ජනපද 80 ක් හා නගර 146 ක් ආවරණය වන පරිදි දළ වශයෙන් ප්‍රදේශ 226 ක් සළකා බලයි. | භාණ්ඩ හා සේවා පැස වාර්ෂිකව සංශෝධනය කෙරේ. |
| ඉන්දියාව | තොග මිල දර්ශකය | ආර්ථික උපදේශකගේ කාර්යාලය | සෑම සතියකදීම, විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන රැසකින් මිල ගණන් 1,918 ක් ලබාගැනේ. | පාදක වර්ෂය වසර 5 - 10 ක කාලයක් තුළ සංශෝධනය කෙරේ. |
| පකිස්ථානය | පාරිභෝගික මිල දර්ශකය | ෆෙඩරල් සංඛ්‍යාන කාර්යාංශය | සමස්ත ජනගහනයෙන් සියයට 68 ක් ආවරණය වන සේ කුඩා, මධ්‍යම හා විශාල නගර 35 ක් ආවරණය කරයි. | වර්තමාන පාදක වර්ෂය වනුයේ 2000/2001 යි. |
| තායිලන්තය | පාරිභෝගික මිල දර්ශකය | වෙළෙඳ හා ආර්ථික දර්ශක කාර්යාංශය | බැංකොක් නාගරික ප්‍රදේශය හා වෙනත් නාගරික ප්‍රදේශ ආවරණය වන පරිදි ආයතන 1,535 කින් මිල ගණන් 65,000 ක් පමණ ලබාගනියි. | දර්ශකයේ පාදක වර්ෂය වසර 5 කට වරක් වෙනස් කෙරේ. |
| ශ්‍රී ලංකාව | කොළඹ පාරිභෝගික මිල දර්ශකය | ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | භූගෝලීය ආවරණය කොළඹ නගර සීමාවට සීමා වී ඇත. | 1952 සිට මේ දක්වා පාදක වර්ෂය වෙනස් කිරීමක් සිදුකර නොමැත. බර තැබීම් සංශෝධනය කිරීම සඳහා කාල සටහනක්ද ඉදිරිපත් කර නොමැත. |

සඳහා වන මූලධර්ම ගැලපීම මගින් සමාජ හා ආර්ථික සංවර්ධනය සඳහා සමෝධානාත්මක දල සටහනක් ඇති කිරීමට බලාපොරොත්තු වේ.

## 4.5 ප්‍රතිපත්ති හා ගැටලු

**ඉහළ නැගෙන හා වෙනස්වන සුළු පාරිභෝගික මිල උද්ධමනය සඳහා හැකි ඉක්මණින් අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගී ඇත.** මුදල් මගින් මෙහෙයවනු ලබන උද්ධමනය කෙරෙහි ශ්‍රී ලංකා මහ බැංකුව තම මූල්‍ය ප්‍රතිපත්තිය හරහා අවධානය යොමු කරමින් පවතී. මෑත කාලීනව ඇති වූ අධික මිල අස්ථාවරභාවය සඳහා ප්‍රධාන හේතුව වූයේ නිෂ්පාදන හා බෙදාහැරීමේ ක්‍රියාදාමය සමග බැඳුණු සුවිශේෂී වූ ව්‍යුහාත්මක ගැටලු මගින් පැන නගින සැපයුමට සම්බන්ධ සාධකයි. විශේෂයෙන් කෘෂි නිෂ්පාදන බහුල කාලවලදී කල්තබා ගැනීමේ ක්‍රම හා බැඳුණු කෘෂිකාර්මික නිෂ්පාදන පරිහරණය හා බෙදාහැරීමේ ක්‍රියාදාමය වැඩිදියුණු කිරීම මගින් මෙවැනි අධික මිල අස්ථායීතාවයන් අඩුකර ගැනීමට හැකිවනු ඇත. විටින් විට කරනු ලබන තීරුබදු සංශෝධනයන් වලින් වැළකී, අපනයනවලට පහසු ගලා ඒම සහ සැකසූ ආහාර කර්මාන්තය සඳහා දිරිගැන්වීම මිලෙහි ඇතිවන අස්ථායීතාවයන් නැති කිරීම සඳහා යොදාගත හැකි අනෙකුත් ක්‍රියාමාර්ග වේ.

**ඉන්ධන මත පවතින අධික පරායත්ත බව සහ ඉන්ධන කාර්යක්ෂම ලෙස භාවිතා කිරීම සඳහා වූ ප්‍රතිපත්තිවල ඌනතාවය හේතුවෙන් ජාත්‍යන්තර මිල උච්ඡාවචනයන්ට අනුව දේශීය මිල මට්ටම්වල ඇඩි අවධානම් බවක් ඇතිකර ඇත.** පවත්නා බලශක්ති ප්‍රභවයන්ගෙන් පූර්ණ ප්‍රයෝජන ලබා ගැනීමට සමත් බලශක්ති සංරක්ෂණය සඳහා ජාතික මට්ටමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවයක් පවතී.

**යල්පැන ගිය දර්ශකවලින් උද්ධමන නැඹුරුව මැනීම නිසා සාමාන්‍ය මිල ඉහළ යාම් පිළිබඳව වූ ප්‍රවනතාවය නිවැරැදි ලෙස පිළිබිඹු නොකරයි.** උද්ධමනය මැනීම සඳහා වැඩි නියෝජනයක් සහිත දර්ශකයක් සකස් කිරීම සහ එය නිල වශයෙන් අදාල සියළුම පාර්ශ්ව විසින් පිළිගනු ලැබීම ඉතා වැදගත් ප්‍රතිපත්තිමය කරුණක් බවට පත්ව ඇත.

**නාමික වැටුප් වල දිගින් දිගට ම ඉහළට සිදු වූ වෙනස්වීම් නිසා උද්ධමනයෙන් ඇති වූ ඍණාත්මක බලපෑම සංසිඳුනු අතර එහි ප්‍රතිඵලයක් ලෙස මූර්ත වැටුප්වල ඉහළ යාමක් සිදු වුවද ඊට සරිලන ලෙස ඵලදායිතාවයේ වර්ධනයක් පැහැදිලි ලෙස රාජ්‍ය අංශයේ සිදු නොවුණි.** මෙම නැමියාව උද්ධමනය කෙරෙහි තවත් පීඩනයක් ඇති කිරීමට හේතු විය. මෙවැනි උපාය මාර්ග තවදුරටත් පමාවීම නිසා තත්ත්වය තවත් උග්‍ර වන අතර පෞද්ගලික අංශයේ වැටුප් වර්ධනයවීමක් කෙරෙහි ද බලපානු ලබයි. අවසානයේ ශ්‍රී ලංකාවේ අපනයන සඳහා ඇති ජාත්‍යන්තර වෙළෙඳපොළ තරගකාරීත්වයට ද මෙය බලපානු ඇත.

**උගත් තරුණ රැකියා වියුක්තිය ඉහළ අගයක් ගන්නා විට ආර්ථිකයේ සමහර අංශ පුහුණු ශ්‍රමික හිඟයක් අත්විඳිනු දක්නට ලැබෙන අතර මෙය පවතින අධ්‍යාපන ක්‍රමයේ අඩුපාඩුව හුවා දක්වයි.** එහෙත් බලාත්මක ජාතික මට්ටමේ වැඩසටහන්වලින් නිපුණතා සංවර්ධනය සඳහා අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල සහයෝගීතාවය අවශ්‍ය වුවද, මෙම වෙනස්වන තත්ත්වයන් හමුවේ දේශීය හා විදේශීය ශ්‍රම වෙළෙඳපොළ දෙකම පුළුල් ලෙස සාකච්ඡාවට භාජනය වෙමින් එකඟ වන්නේ අවශ්‍ය වැඩසටහන්වල ඇති වී ඇති පමාවයි. මෙයින් පැහැදිලි වන්නේ සමහරක් සේවා යෝජකයන් විසින් ඔවුන්ගේ අවශ්‍යතාවය සඳහා ඉහළ මට්ටමේ මානව ප්‍රාග්ධනය ආනයනය කිරීමේ අවස්ථා පිළිබඳ අවධානයෙන් සිටින බවයි.

**විදේශගතව සිටින ශ්‍රී ලාංකිකයන් විසින් එවනු ලබන මුදල්වලින් ශ්‍රී ලංකාවේ බාහිර අංශයන්ගෙන් ඇතිවන පීඩනයට සැලකිය යුතු සහනයක් ඇති කරයි.** කෙසේ වුවත්, ශ්‍රී ලංකාව තවමත් වැඩි වශයෙන් ම සපයනු ලබන්නේ අඩු ඉල්ලුමක් ඇති නුපුහුණු ශ්‍රමිකයන් වන අතර ඒ නුපුහුණු ශ්‍රමිකයන්ට රැකියා අවස්ථා වැඩි ප්‍රතිශතයක් ඇත්තේද මැද පෙරදිගටයි. වැඩසටහන් වෙනස් කළ යුත්තේ වෙනස් රැකියා කාණ්ඩවලින් හා වෙනස් භූගෝලීය ප්‍රදේශවලට ශ්‍රම සැපයුමෙනි. මෙය විදේශ විනිමය ගෙන ඒමේ ශ්‍රී ලංකා ධාරිතාවය වැඩි කරවන අතර දුගීකම අඩු කරවන හා ග්‍රාමීය සංවර්ධනය ඇති කරවන වැඩසටහන්වලට උපකාරී වේ. තවද, මෙවැනි රැකියා බලාපොරොත්තු වැඩි ප්‍රමාණයක්ම තවම ඇත්තේ දුගී ග්‍රාමීය අය තුළය. මේ නිසා තවදුරටත් මූල්‍ය පද්ධතිය තුළ වැඩිපුර විදේශ මුදල් ප්‍රමාණයක් රට තුළට ගලා ඒම ආකර්ශණය කර ගැනීමට උපක්‍රමශීලී යාන්ත්‍රික ක්‍රියාවලියක් අවශ්‍ය වේ.